# ගුරු මාර්ගෝපදේශය
# කතෝලික ධර්මය

(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

# 1
## පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ගුරු මාර්ගෝපදේශය

# කතෝලික ධර්මය

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

# 1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

කතෝලික ධර්මය
ගුරු මාර්ගෝපදේශය
1 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2026

©ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි.
**ISBN**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : **www.nie.ac.lk**

# ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම් ලාභියෙකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, විසි එක් වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසි භාවය, වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂයමාලාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගි සංවාදයක් ඔස්සේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම මෙම කාර්යයේදී විශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි, මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන්ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයයන් නවීකරණය වන අතර ම නව විෂයයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය වෙයි. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම පාසල් විෂයයක් සඳහා ම ඉගෙනුම් ද්‍රව්‍ය හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේදී 1 ශ්‍රේණිය සඳහාත් 2027 වර්ෂයේදී 2 ශ්‍රේණිය සඳහාත් 2028 වර්ෂයේදී 3 ශ්‍රේණිය සඳහාත් 2029 වර්ෂයේදී 4 ශ්‍රේණිය සඳහාත් 2030 වර්ෂයේදී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් පොත් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් සිදු කෙරෙයි. ගුරුවරුන්ට ලබා දෙන උපදෙස් ගුරු මාර්ගෝපදේශවල ඇතුළත් කර ඇති අතර සිසුන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවලට යොමු කර සිසු හැකියා සංවර්ධනයට මෙම විෂයමාලාව බෙහෙවින් උපකාර වන බව අපගේ විශ්වාසයයි. විසි එක්වන සියවසේ කුසලතා සංවර්ධනයටත් එමගින් සිසු පෞරුෂය සංවර්ධනයටත් හඳුන්වා දෙනු ලබන විෂයමාලාවේ ඇතුළත් ක්‍රියාකාරකම් මනා පිටුබලයක් වනු ඇත.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීමේදී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මෙම ඉගෙනුම් ද්‍රව්‍ය ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂයමාලා දායකත්වය

### උපදේශකත්වය

මහාචාර්ය, මංජුලා විතානපතිරණ, අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය, දර්ශන සමරවීර මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය

### අධීක්ෂණය

ආර්. එම්. කේ. ද සිල්වා, අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

### විෂයය සම්බන්ධීකරණය :

ලක්මාලි ආනන්දගොඩ, සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

### ලේඛක මණ්ඩලය

පී.ඩී. ගිලීෂියා අයිරින්, කලාප අධ්‍යාපන කාර්යාලය , කැලණිය
එම්. පී. ඩබ්. වී. ශ්‍යාමලී පීරිස්, බප/කැල/පිලපිටිය ජනාධිපති විදුහල, පිලපිටිය, කැලණිය
ඩී. එම්. බී. මදුරාවල, කලාප අධ්‍යාපන කාර්යාලය, මිනුවන්ගොඩ
කේ. ඩී. පී. කරුණානායක, සිරි කුරුස විදුහල, ගම්පහ
එච්. බී. සී. නිලන්ති, බප/කැල/ශාන්ත ආනා බාලිකා ප්‍රාථමික විදුහල, වත්තල

### සංස්කරණය

ගරු එල්. පී. කේ. එල්. ප්‍රනාන්දු පියතුමා, සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
ගරු රොයිස්ටන් පීරිස් පුල්ලේ පියතුමා, සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
ගරු එස්. වී. ක්‍රිශාන්ති ප්‍රනාන්දු පැවිදි සොයුරිය, ශුද්ධවූ පවුලේ කන්‍යාරාම විදුහල, දෙහිවල

### භාෂා සංස්කරණය

ඩබ්ලිව්. කරුණාරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම

### පිට කවරය හා චිත්‍ර

කේ. ඇනා මරී පෙරේරා, ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, බම්බලපිටිය

### පරිගණක අක්ෂර සංයෝජනය (ග්‍රැෆික් නිර්මාණකරු)

කාංචනා ආර්. පද්මපෙරුම, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

# පටුන

| | |
|---|---|
| ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iv |
| විෂයමාලා දායකත්වය | v |
| පටුන | vii |
| ආගම් හා සාරධර්ම අධ්‍යාපනය - ප්‍රාථමික අධ්‍යාපනය - හැඳින්වීම | viii |
| විෂය නිර්දේශය | xiv |
| අන්තර්ගතය - පළමුවන වාරය | 1 |
| අන්තර්ගතය - දෙවන වාරය | 18 |
| අන්තර්ගතය - තුන්වන වාරය | 35 |

## ආගම් හා සාරධර්ම අධ්‍යාපනය - ප්‍රාථමික අධ්‍යාපනය

### හැඳින්වීම

සංස්කෘතික වශයෙන් විවිධ වූ සමාජයක ආගම ඉගැන්වීම සංවේදී කාරණයකි. විවිධ ආගම්වල දාර්ශනික හා ප්‍රායෝගික අංශවල විවිධ වෙනස්කම් තිබේ. එබැවින් ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ ම ආයතනික සැකැස්ම තුළ විවිධ ආගමික ක්‍රියාකාරකම් හේතුවෙන් ඔවුන්ව තනි වේදිකාවකට ගෙන ඒම අපහසු ය. ජාතික ආර්ථිකයට, සංවර්ධනයට සහ සංහිඳියාවට ද එය අහිතකර අයුරින් බලපා ඇත. වෙනස් ප්‍රවේශයකින් කටයුතු කිරීම ජාතික අවශ්‍යතාවක් ව පවතී. ඒ අනුව, ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය සඳහා වූ ජාතික විෂයමාලා රාමුවේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික අධ්‍යාපනයට ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය උපකාර වන ආකාරය පෙන්වීමයි.

ආගම් සහ සාරධර්ම අධ්‍යාපනයේ අවසාන අරමුණ වන්නේ දරුවෙකුගේ වයසට සරිලන පරිදි ආගමික අධ්‍යාපනයක් ලබා දීමයි. කුමන ආගමකට අයත් වුව ද හිස, හදවත, අත, මනස සමග සමපාත වන පරිදි ආකල්ප සංවර්ධනය කිරීම මගින් අනාගත ලෝකය ජයගත හැකි විනයගරුක නිර්මාණශීලී පුද්ගලයකු සමාජයට දායාද කිරීම අවශ්‍යය වේ.

ප්‍රධාන සමාජ-ආගමික සංකල්ප පහක් යටතේ ගොඩනගා ඇති මෙම ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය සඳහා වන විෂයමාලා රාමුවෙන් අධ්‍යාත්මික සංවර්ධනයට මෙන් ම පුද්ගල සංවර්ධනයට ද අවශ්‍ය මූලික කුසලතා ගොඩනැගීම අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම විෂයමාලා රාමුවෙන් බලාපොරොත්තු වන්නේ අනාගත අභියෝගවලට උද්‍යෝගයෙන් සහ ධෛර්ය සම්පන්නව මුහුණ දිය හැකි කාර්යක්ෂම නව්‍ය පුද්ගලයන් සමාජයට දායාද කිරීම සඳහා අවශ්‍ය පදනම ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ම ගොඩනැගීමයි.

ප්‍රාථමික අධ්‍යාපනය සඳහා කතෝලික ධර්මය විෂය නිර්දේශ සැකසීමේදී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ළැදියා කෙරෙහි සැලැකිලිමත් වී තිබේ. අදාළ ඉගෙනුම් පල අත්පත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ජීවිතයේදී අද්දැකීම් ලද හැකි ආකාරයේ ක්‍රියාකාරකම්වල නිරතවීමට අවස්ථා සම්පාදනය කර දී ඇත.

කුඩා දරුවකුට කතෝලික ධර්මය ඉගැන්වීම අතිශය වගකීමක් සහිත ව කළ යුත්තකි. කුඩා අවධියේ ඉතා සුළු වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වැරැදි වැටැහීමක් ඇති වුව හොත් එය එම දරුවාගේ මෙලොව ජීවිතයට පමණක් නොව සදා ජීවිතයට ද බලපෑමට ඉඩ ඇත. එබැවින් නොදන්නා හෝ සැකමුසු හෝ කරුණු ඇතොත් ඒ සියල්ල මැනැවින් දැන ගෙන නිවැරදි දේ ම ඉදිරිපත් කිරීමට සියලු ගුරුවරුන් අනතිමානී විය යුතුවාක් මෙන් ම පුරෝගාමී විය යුතු ය.

සිසුන්ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිත ගොඩනගා ගැනීම ගුරුවරුන්ගේ වගකීමකි. සැම ගුරුවරයකු විසින් ම නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීම මගින් සිසුන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගත හැකි ය.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

ප්‍රාථමික ශ්‍රේණිවල කිතු දහම ඉගැන්වීමේදී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. වන්දනා, ආගමික චාරිකා, දේවස්ථාන නැරඹීම්, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. තව ද උපමා, චරිත කතා, ගැලවීමේ ඉතිහාසය හා සම්බන්ධ කතා රසවත් ව ඉදිරිපත් කළ යුතු ය.

මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කර වීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එවිට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වින්දනයක් ගෙන දෙන ඉතා ම සුන්දර අද්දැකීමක් වෙමින් කතෝලික ධර්මය ඉගෙනීමේ දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු නොඅනුමාන ය.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් කතෝලික ධර්මය විෂයට අදාළ සංකල්ප බොහොමයක් ගොඩනැගිය හැකි ය. පාසල් සංස්කෘතිය තුළ මෙම සංකල්ප ගොඩනැගෙන නව අංග නිර්මාණය කෙරෙහි විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. මෙම වැඩසටහන පළමුවන ශ්‍රේණියේදී ඉතා සරල ව අරඹා පස්වන ශ්‍රේණිය තෙක් ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

ගුරුවරයා විසින් තම සිසුන් වාරයකට එක් වතාවක් හෝ දේවස්ථානයට රැගෙන යා යුතු ය. එහිදී කෙරෙන වතාවත් ඇසුරින් සිසුන් තුළ ශ්‍රද්ධාව ජනිත වෙයි. මෙම ක්‍රියාකාරකම් මගින් ගිහි - පැවිදි සම්බන්ධතාව ද වර්ධනය වී යහපත් සමාජයක් බිහි වීමට එය ද හේතුපාදක වනු ඇත.

පුද්ගල පවිත්‍රතාව, විනීතවත්බව, කරුණාව, දයාව, ආශීර්වාද ඇසුරෙන් ගොඩනැගෙන සමානාත්මතාව, සුහදත්වය, සහයෝගය ආදී ලක්ෂණවලින් පාසල් සංස්කෘතිය පෝෂණය වී ඇත. එවැනි සංස්කෘතියක් තුළ ආගම් හා සාරධර්ම විෂයයෙන් අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප තහවුරු කිරීම ඉතා පහසු වේ. එවැනි වාතාවරණයක් ඇති කල්හි විෂය තුළදී ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

## තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවලදී ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් ක්‍රම ශිල්ප මේ සඳහා උචිත වෙයි.


## ආගම් හා සාරධර්ම විෂයයේ අරමුණ

තිරසාර සාම සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් අවබෝධයක් ඇති විවිධත්වයට ගරු කරන චිත්තවේගීය ව සමතුලිත, ප්‍රජාතන්ත්‍රවාදී සහ විනයගරුක ගෝලීය පුරවැසියකු නිර්මාණය කිරීම.

## ආගම් හා සාරධර්ම විෂයය ඉගෙනීමේ අභිමතාර්ථ

1. දැහැමි, විනයගරුක සහ චිත්තවේගීය වශයෙන් සමතුලිත වූ පුරවැසියන් බිහි කිරීම
2. මානව වටිනාකම් මත පදනම් වූ විවිධ චාරිත්‍ර වාරිත්‍ර පිළිවෙත් සහ සම්මතයන් අගය කිරීම
3. අප අවට ඇති වෙනස්කම් තාර්කික ව පිළිගනිමින් සහ ගරු කරමින් සමාජ සහජීවනය ශක්තිමත් කිරීම
4. අභ්‍යන්තර සාමය සහ ආධ්‍යාත්මික සතුට භුක්ති විඳීම සහ බෙදා ගැනීම
5. පුද්ගල සහ විවිධ සමාජ අතර සෞඛ්‍ය සම්පන්න සබඳතා ප්‍රවර්ධනය කිරීම
6. සමාජ-සංස්කෘතික සහ පාරිසරික සංවේදිතාවන්ට දායක වෙමින් අභියෝග සමග ධනාත්මක ලෙස කටයුතු කිරීම

## ආගම් හා සාරධර්ම විෂයයේ
## අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප



| ආගම් හා සාරධර්ම අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය මූලික සංකල්ප | |
|---|---|
| චරිත සංවර්ධනය | ඕනෑ ම අභියෝගයක් ජය ගැනීමේ හැකියාවකින් යුතු ධනාත්මක ආකල්ප පෝෂණය කිරීම මෙන් ම ශාරීරික, මානසික, සමාජීය හා චිත්තවේගීය වශයෙන් මනා පෞරුෂයකින් යුතු පුද්ගලයෙකුගේ පදනම සැකසීම |
| සමාජීය හා සංස්කෘතික සංවේදීතාව | ආගම් හා සංස්කෘතික භේදයෙන් තොරව සැම දෙනා සමග ම සුහදශීලීත්වයෙන් හා දැනුවත්බවෙන්, අවබෝධයෙන්, පිළිගැනීමෙන් මෙන් ම වෙනස් සමාජ සංස්කෘතික පසුබිම් පිළිබඳ සංවේදී වෙමින් කටයුතු කිරීමේ හැකියාව |
| පාරිසරික සංවේදීතාවය | පාරිසරික සංවේදිතාව මගින් පුද්ගලයෙකුට ඔවුන්ගේ පරිසරය පිළිබඳ තොරතුරු අවබෝධ කර ගැනීමට සහ සැකසීමට ඇති හැකියාව විස්තර කෙරේ. එය සැම ආගමික දර්ශනයක ම පාහේ දක්නට ලැබෙන මූලික ලක්ෂණයකි. එය තීරණාත්මක සාධකයක් වන්නේ එය පුද්ගලයෙකුට විවිධ පාරිසරික තත්ත්වයන්ට අනුවර්තනය වීමට ඉඩ සලසන බැවිනි. |
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන් | තිරසර සමාජ යහපැවැත්මකට අත්‍යවශ්‍ය වන පිළිගත් සමාජ, සංස්කෘතික හා ආගමික වටිනාකම්, ප්‍රතිපත්ති, ආචාරධර්ම, සාරධර්ම හා සම්මත ඇසුරෙන් ජීවිතය හැඩගස්වා ගැනීම |
| සතිමත්බව, සෞඛ්‍යය හා යහපැවැත්ම | ශාරීරික හා මානසික සමබරතාව පවත්වා ගනිමින් ආතතියකින් තොරව නිරෝග ජීවිතයක් සඳහා නිරන්තරයෙන් යහපත් සිහිය පවත්වා ගැනීම |

| ආගම් හා සාරධර්ම<br>ප්‍රාථමික අධ්‍යාපනය සඳහා මූලික සංකල්පවලට අදාළ විස්තර වාක්‍ය | |
|---|---|
| චරිත සංවර්ධනය | ගුරුවරුන්ගේ හා වැඩිහිටියන්ගේ මග පෙන්වීම යටතේ 'ආගම' යන සංකල්පය හඳුනා ගනිමින් සිය චරිතය හා හැසිරීම් නිවැරදි ව හැඩගස්වනු ලබන සරල ආගමික ක්‍රියාකාරකම්වල නියැලෙයි. |
| සමාජීය හා සංස්කෘතික සංවේදීතාව | තමා ජීවත් වන බහු ආගමික වටපිටාව තුළ පවතින ආගම් මත පදනම් වූ උත්සව, ඇඳුම් පැලඳුම්, ආචාර සමාචාර ආදිය පිළිබඳ අද්දැකීම් ලබමින් සංස්කෘතික විවිධත්ව පිළිබඳ අවබෝධයෙන් යුතු ව සියලු දෙනා සමග සහයෝගයෙන් කටයුතු කරයි. |
| පාරිසරික සංවේදීතාව | ජීවිතය පරිසරය සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින ආකාරය ආගම මගින් තේරුම් ගනිමින් පරිසරය කෙරෙහි සංවේදී ව කටයුතු කරයි. |
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මත | ආගම්වලට අදාළ ව සිදු කරන වත්පිළිවෙත්, වන්දනාමාන හා භාවිත කරන සුවිශේෂ වචන පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>ආගමික ස්ථානවලට සුදුසු ඇඳුම් පැලඳුම් භාවිතයටත්, නිවැරදි හැසිරීම් පවත්වා ගැනීමටත් කටයුතු කරයි.<br>යහපත් දරුවකු ලෙස පිළිපැදිය යුතු යහපුරුදු, සිරිත්විරිත් අනුගමනය කරමින් අන්‍යයන් සමග සහයෝගයෙන් හා ගෞරවයෙන් කටයුතු කරයි. |
| සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම | එදිනෙදා කාර්යයන් සතිමත් ව (Mindfully) කිරීමට පුරුදු පුහුණු වෙමින්, තම කටයුතු නිරවුල් ව හා ප්‍රීතිමත් ව සිදු කරයි. හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. |

## 1 ශ්‍රේණිය - ආගම් හා සාරධර්ම විෂය නිර්දේශය

| සංකල්පය | ඉගෙනුම් පල | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| **චරිත සංවර්ධනය** | 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම් වාග් මාලාව සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ සංකල්පය හඳුනා ගනියි. | 1.1 ආගමට සුවිශේෂ වූ අවස්ථාවන්වලට සහභාගි වී අද්දැකීම් ලබයි. | 1.1.1 සහභාගි වීම |
| | | 1.2 ආගමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හිදී භාවිත කරයි. | 1.2.1 සුවිශේෂ ආගමික වදන් හඳුනා ගැනීම<br><br>1.2.2 උචිත අවස්ථාවන්හිදී භාවිත කිරීම |
| | | 1.3 ආගමට අදාළ මූලික සංකේත හඳුනා ගනියි. | 1.3.1 සංකේත හඳුනා ගැනීම |
| | | 1.4 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.4.1 ආගමික පාඨ හඳුනා ගැනීම<br><br>1.4.2 ආගමික පාඨ භාවිත කිරීම |
| | 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර/ ආගමික කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන්දීම |
| | | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංගයක් ප්‍රකාශ කිරීම |
| | | 2.3 ආගමික කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| | | 2.4 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.1 උපදේශ කාව්‍යකට සවන්දීම<br><br>2.4.2 තාලයට ගායනා කිරීම |

| | | | |
|---|---|---|---|
| | | 2.5 උපදේශ කාව්‍යක් ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.5.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| **සමාජීය හා සංස්කෘතික සංවේදීතාවය** | 3. ආගමික සිද්ධස්ථාන හඳුනා ගෙන එම ස්ථානවලදී ගෞරවාන්විත ව හැසිරෙයි. | 3.1 තම ආගමික ස්ථානය හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 ස්ථානය හඳුනා ගැනීම<br><br>3.1.2 ස්ථානය නම් කිරීම |
| | | 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූල ව හැසිරීම |
| | | 3.3 සුදුසු ඇඳුම, නිවැරදි කතාබහ භාවිත කරයි. | 3.3.1 නිවැරදි කතාබහ<br><br>3.3.2 නිවැරදි ඉරියවු භාවිතය |
| | 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගි වීම |
| | | 4.2 සුවිශේෂ සංස්කෘතික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.2.1 ක්‍රියාකාරීව සහභාගි වීම |
| | | 4.3 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.1 ක්‍රියාකාරකම්වල නිරත වීම<br>4.3.2 අදහස් ප්‍රකාශ කිරීම<br>4.3.3 නිර්මාණශීලීබව<br>4.3.4 උපකරණ භාවිතය |

| | | | |
|---|---|---|---|
| **ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන්** | 5. පූජනීය ස්ථානවලදී නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් අනුගමනය කරයි. | 5.1 පූජනීය ස්ථානවලදී අනුගමනය කළ යුතු නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් හඳුනා ගනියි. | 5.1.1 නිවැරදි වත්පිළිවෙත් ප්‍රකාශ කිරීම<br><br>5.1.2 නිවැරදි සිරිත් විරිත් ප්‍රකාශ කිරීම |
| | | 5.2 නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත්වලට අනුව කටයුතු කරයි. | 5.2.1 කටයුතු කිරීම |
| | 6. ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.1 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි වත්පිළිවෙත්වල යෙදෙයි | 6.1.1 නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම |
| | | 6.2 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කරයි. | 6.2.1 නිවැරදි සිරිත් විරිත් අනුගමනය කිරිම |
| | | 6.3 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කිරීම |
| | | 6.4 ආගමික කටයුතුවලදී අදාළ වචන භාවිත කරයි. | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම |
| | 7. යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම/ සිරිත් විරිත් අනුගමනය කරයි. | 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම හඳුනා ගනියි. | 7.1.1 නිවැරදි ව හඳුනා ගැනීම |
| | | 7.2 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සිරිත් විරිත් හඳුනා ගනියි. | 7.2.1 නිවැරදි ව හඳුනා ගැනීම |
| | | 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 නිවැරදි හැසිරීම |

| | | | |
|---|---|---|---|
| **පාරිසරික සංවේදීතාවය** | 8. තමා අවට පරිසරය පිරිසිදුවට හා පිළිවෙළකට තබා ගැනීමට ක්‍රියා කරයි. | 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 ක්‍රියාකාරී ව සහභාගී වීම |
| | | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.1 අදහස් ප්‍රකාශ කිරීම<br>8.2.2 නිර්මාණශීලී බව<br>8.2.3 උපකරණ භාවිතය<br>8.2.4 අගය කිරීම |
| | 9. ආගමික ශාස්තෘන් වහන්සේලා සොබාදහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳ ව දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | 9.1 කතන්දර/ කවි ඇසුරෙන් සොබා දහමේ වටිනාකම හඳුනා ගනියි. | 9.1.1 අවධානයෙන් සවන්දීම<br>9.1.2 අවබෝධ කර ගැනීම<br>9.1.3 අදහස් ප්‍රකාශ කිරීම |
| | | 9.2 පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරයි. | 9.2.1 අරපිරිමැස්මෙන් භාවිත කිරීම |
| | | 9.3 සතුන්ට ආදරය කරයි. | 9.3.1 ආදරය කිරීම |
| | | 9.4 සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.4.1 ආහාරපාන ලබා දීම |
| **සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම** | 10. හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.1 යහපත් දින චර්යාවක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | 10.1.1 අනුපිළිවෙළ ප්‍රකාශ කිරීම |
| | | 10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.2.1 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම |
| | 11. දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතු ව කටයුතු කරයි. | 11.1 ඇවිදීමේදී මනා සිහියෙන් යුතු ව ඇවිදියි. | 11.1.1 සිහියෙන් ඇවිදීම |
| | | 11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රළු- සිනිඳු, තෙත- වියළි, උණුසුම-සිසිල්බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 රළු- සිනිඳු, තෙත- වියළි, උණුසුම-සිසිල්බව හඳුනා ගැනීම |
| | | 11.3 සරල භාවනාවක (Meditation) යෙදෙයි. | 11.3.1 නිවැරදි ඉරියව් අනුගමනය කිරීම<br>11.3.2 භාවනා කිරීම |

# අන්තර්ගතය

## පළමුවන වාරය


| | |
|---|---|
| 1. අසිරිමත් මැවිල්ල | 2 |
| 2. අපේ ආදි මව්පියන් | 5 |
| 3. දෙව් මැදුරට යමු | 7 |
| 4. සිරි කුරුසිය | 10 |
| 5. සාන්ත කුරුසිය අඳිමු | 13 |
| 6. සතිමත්ව ඇවිදිමු | 15 |

# 1 සංකල්පය - චරිත සංවර්ධනය
# අසිරිමත් මැවිල්ල

අසිරිමත් මැවිල්ල තුළින් මහෝත්තම දෙව්පියාණන් වහන්සේ හඳුන්වා දීමත්, දරුවන් තුළ විශ්වාසය ජනිත කරවීමත්, පරිසරය අගය කිරීම මගින් චරිත සංවර්ධනය කිරීමත් මෙයින් අපේක්ෂා කරයි.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | දෙවි පියාණන් වහන්සේගේ ආදරය | 2.3 ආගමික කතාන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| | | 2.4 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.2 තාලයට ගායනා කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- සුන්දර පරිසරය අඩංගු චිත්‍ර (සිසු ක්‍රියාකාරකම් පොත)
- කිතුනු ගී පොත - ගී අංක 27
- ඉරෙන් හඳෙන් ගීතය, ඇතින් ඇසෙනා ගීතිකාව (සංයුක්ත තැටිය/යූටියුබ්)
- විවිධ මැවිලි නිරූපණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය
- චිත්‍ර පාට කිරීමට අවශ්‍ය වර්ණ
- කුරුලු ලැල්ල සහ ආහාර
- යාච්ඤාව අඩංගු පෝස්ටරය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- සිසුන් සියලු දෙනා ක්‍රියාකාරකම්වල යෙදිය හැකි පරිදි ස්ථානගත කරන්න. සංයුක්ත තැටිය/යූටියුබ් ඇසුරෙන් ඉරෙන් හඳෙන් ගීතය සිසුන්ට ඇසෙන්නට සලස්වන්න.

"ඉරෙන් හඳෙන් එළිය අරන් - ගහෙන් වැලෙන් සුවඳ අරන්....."

පද රචනය :- සෝමරත්න දිසානායක<br>
ගායනය :- හර්ෂණ දිසානායක<br>
සංගීතය :- රෝහණ වීරසිංහ

- ගීතයට සවන්දීමට සිසුන් යොමු කරන්න, සිසුන් හා එක්ව ගීතය ගායනා කරන්න.
- ගායනයේ යෙදෙමින් සිසුන් සමග රංගනයේ යෙදෙන්න.
- ගීතය ගැන සිසු අදහස් විමසන්න. මේ සියල්ල මවා වදාළේ දෙවි පියාණන් වහන්සේ බව පවසන්න.
- දෙව්පියාණන් වහන්සේ මැවූ ලෝකයේ අසිරිය විඳින්නට සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- ඉහළ අහස දෙස බලන්නට සිසුන් යොමු කරන්න.
- පහළ පොළව දෙස විමසිලිමත්ව බලමින් අවට අසිරිය විඳින්නට සිසුන් යොමු කරවන්න.
- දෑස පියා ගෙන පරිසරයේ ඇසෙන විවිධ හඬවල් රස විඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- හමන සුළඟේ පහස විඳින්නට සිසුන්ට ඉඩ ලබා දෙන්න.
- ගස් වැල් ඉර, හඳ යන සැම දේම දෙවියන් වහන්සේ මැවූ බව සිසුන්ට අවබෝධ කරවන්න.


- සිසුන්ගේ අද්දැකීම් පිළිබඳ සංවාදයේ යෙදෙන්න.
- පෙර දැනුම් දුන් පරිදි දෙවියන් වහන්සේගේ මැවිල්ලට අනුගත වෙමින් තම චරිත අන් අය ඉදිරියේ නිරූපණය කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන මැවිලි ආරෝපණය කර ගෙන ඉදිරිපත් කිරීමට සිසුන් සූදානම් කරවන්න.



මම මලක්

මාව මැව්වේ දෙවියන් වහ්නසේ


මම හරිම සුවඳයි



මම මිදි පොකුරක්

මාව මැව්වේ දෙවියන් වහන්සේ


මම හරිම රසයි



මම මාළුවෙක්

මාව මැව්වේ දෙවියන් වහන්සේ

මට පීනන්න පුළුවන්



මම හාවෙක්

මාව මැව්වේ දෙවියන් වහන්සේ

මට පැන පැන යන්න පුළුවන්

මෙම රංගනය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සිසුන්ව ඇගයීමට ලක් කරමින් සංවාදයක යෙදෙන්න. මම සුන්දර මැවිල්ලක් ලෙස මැවිල්ල ආරක්ෂා කරන්නේ කෙසේද? පිළිතුර අගයන්න.

පියවර 2

- දෙවියන් වහන්සේ අපට දුන් සුන්දර මැවිලිවලින් පිරි ලෝකය රැක බලා ගැනීමට සිසුන්ට කළ හැකි දේ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. සිසු අදහස් අගයන්න.
- සිසුන්ට කළ හැකි දේ අභිරූපණය මගින් ඉදිරිපත් කරන්නට සලස්වන්න.

උදා : මම අහසේ ලස්සන බලනවා - මම මල් කඩලා විසි කරන්නේ නැහැ
මම සුරතල් සතුන්ව ආදරයෙන් බලා ගන්නවා

- සිසු ක්‍රියාකාරකම් අගය කරන්න.
- සිසුන් ව සන්සුන් කරවා යාච්ඤාවට සූදානම් කරවන්න.
- නැගිට නිවැරදි ඉරියව්වෙන් දෑත් වැඳ පහත යාච්ඤාව සිසුන් සමග උච්චාරණය කරන්න.
- යාච්ඤාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.

**ආදර දෙව්පියාණනි ඔබ වහන්සේ මැවූ ලස්සන ලෝකයට ගොඩාක් ස්තුතියි. ආමේන්**

- ගීතිකාවට සවන් දෙන්නට සිසුන් යොමු කරවන්න.
- සිසුන් හා එක්ව අලුත් ඉරක් පායලා ගීතිකාව ගායනා කරන්න.

පියවර 3

- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 3 යටතේ ඇති ගසට මල්, කොළ, ගෙඩි ඇඳින්න, එහි ඇති වගන්ති සිසුන් සමග ශබ්ද නඟා උච්චාරණය කරන්න. මැවිල්ල ආරක්ෂා කරන ආකාරය සිසුන්ට පහදා දෙන්න.

- දෙමව්පියන් දැනුවත් කර කුරුලු ලැල්ලක් සාදා ගැනීමට කටයුතු කරන්න.
- රැගෙන ආ ආහාර කුරුලු ලැල්ල මත තබා ඒ පිළිබඳ ව නිරීක්ෂණය කරවන්න. සිසුන් හා එක්ව "ඇතින් ඇසෙනා ඒ ගීරාවේ "ගීතිකාවට සවන් දී ගෞරවයෙන් ගායනා කරන්න.

ඇතින් ඇසෙනා ඒ ගී රාවේ - සමිඳුනි ඔබේ පැසසුම් කියැවේ
කඳු වැටි පීරා හමනා සුළඟේ - සමිඳුනි ඔබේ පැසසුම් කියැවේ
ජය ශ්‍රී වේවා පැසසුම් වේවා - සමිඳේ ඔබ නිති සැරදේවා
ගලමින් බසිනා ගඟ දිය රැල්ලේ - සමිඳුනි ඔබේ පැසසුම් කියැවේ
ගල්පර පීරා හැලෙනා ඇල්ලේ - සමිඳුනි ඔබේ පැසසුම් කියැවේ

- සුන්දර මැවිල්ල ආරක්ෂා කරන අන්දම සිසුන්ගෙන් විමසා එය නැවත නැවතත් අවබෝධ කරවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස්:**

- පින්තූරය හොඳින් නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඉන් ඉස්මතු වන අදහස් ප්‍රකාශ කිරීමට සිසුන් පොලඹවන්න.
- මෙම ගීතය ගායනා කරවන්න. ඉන් පසු සියලුම දෙනා රංගනයක යොදවන්න.
- කඩඉරි මත ඇඳි රූප ප්‍රථමයෙන් සම්පූර්ණ කරවන්න.
- දෙවනුව සතුන් පාට කර ඉන් පසුව ඉතිරි රූප සම්පූර්ණ කරවන්න.
- සිසුන්ට මින් කැමති අවස්ථාවක් තෝරා ගෙන එය රඟ දක්වන්නට සලස්වන්න.
- මෙම ගස අඩංගු රූපය සම්පූර්ණ කරවන්න. කුරුලු ලැල්ල පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. අඩංගු වගන්ති සිසුන් සමග කියවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.3 ආගමික කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | දෙවි පියාණන් වහන්සේගේ සුන්දර මැවිල්ල ආරක්ෂා කරන ආදර්ශ ප්‍රකාශ කරයි. | දෙවි පියාණන් වහන්සේගේ සුන්දර මැවිල්ල ආරක්ෂා කරන ආදර්ශයක් ප්‍රකාශ කරයි. | දෙවි පියාණන් වහන්සේගේ සුන්දර මැවිල්ල ආරක්ෂා කරන ආදර්ශයක් සහය ඇතිව ප්‍රකාශ කරයි. | දෙවි පියාණන් වහන්සේගේ සුන්දර මැවිල්ල ආරක්ෂා කරන ආදර්ශ ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 2.4 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.2 | සුන්දර මැවිල්ල ආරෝපණය කර ගනිමින් තාලයට ගායනා කරයි. | සුන්දර මැවිල්ල ආරෝපණය කර ගනිමින් ගායනා කරයි. | සුන්දර මැවිල්ල ආරෝපණය කර ගනිමින් සහය ඇතිව ගායනා කරයි. | සුන්දර මැවිල්ල ආරෝපණය කරගනිමින් ගායනා කිරීමට දුෂ්කරතා දක්වයි. |

# 2

සංකල්පය - චරිත සංවර්ධනය

# අපේ ආදි මව්පියන්

**දෙවි පියාණන් වහන්සේගේ ආදරය ප්‍රකාශ කරමින් අපේ ආදි මව්පියන් මවා ඔවුන් ව ඒදන් උයනේ පදිංචි කිරීමත් ආදම් හා ඒව දෙවිපියාණන් වහන්සේට අකීකරු වීම හා කායින් ආබෙල් කතා පුවත අවබෝධ කර දීමත් දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීමත් මෙයින් අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතන්දර/ආගමික කතන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | දෙව්පියාණන් වහන්සේ මැවූ ආදි මව්පියන් හා දරුවන් | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කිරීම |
| | | 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන්දීම |

**ඉගෙනුම් සම්පත් :**

- මැවීමේ කතාව ඇතුළත් විඩියෝ පටය
- ශුද්ධ බයිබලය උත්පත්ති 1:27-28 හා උත්පත්ති 2:8-9
- ඉරා ගත් පාට පාට කඩදාසි, ගම්
- සිසු ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 3 අඩංගු පෝස්ටරය
- යාච්ඤාව අඩංගු පෝස්ටරය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- බා ගත කර ගත් වීඩියෝ පටය නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ආදම් ඒව , ඒදන් උයන, කායින්, ආබෙල් පිළිබඳ කතාබහ කරන්න.
- විඩියෝ පටය තුළින් නරඹන ලද ආදි මව්පියන් පිළිබඳ සිසු අදහස් විමසන්න.
- අපේ ආදි මව්පියන් ආදම් හා ඒව බව පෙන්වා දෙන්න.
- දෙවි පියාණන් වහන්සේගේ ආදරය තුළ මවන ලද ආදි මව්පියන් ඒදන් උයන තුළ ගත කළ ජීවිතය පිළිබඳ ඉදිරිපත් කර, ඔවුන් අකීකරු වූ අයුරු විස්තර කරන්න.
- ආදි මව්පියන්ගේ දරුවන් වන කායින් හා ආබෙල් පිළිබඳ තොරතුරු ද සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සියලුම සිසුන්ව යාච්ඤාවට සූදානම් කරන්න.
- සිසුන් හා එක්ව යාච්ඤාව උච්චාරණය කරන්න.
- පහත යාච්ඤාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.

**ආදර දෙව්පියාණනි, අපේ ආදි මව්පියන් තුළින් ඔබ වහන්සේගේ ආදරය අපට පෙන්වූ නිසා ඔබ වහන්සේට ගොඩාක් ස්තුතියි. සුන්දර මැවිල්ල ආරක්ෂා කිරීමට අපට වරම් දුන මැනව. ආමෙන්**

පියවර 2

- ශුද්ධ බයිබලයේ උත්පත්ති 1:27-28 හා උත්පත්ති 2:8-9 යන වගන්ති කියවා සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- ඒදන් උයනේ අපේ ආදි මව්පියන්ට දෙවියන් වහන්සේ සියලු දේ ලබා දුන් බවත් ඔවුන් එහි ඉතාමත් සතුටින් ජීවත් වූ බවත් සිසුන්ට අවබෝධ කර දෙන්න.

- දෙවි පියාගේ උතුම් ගුණාංග සිසුන්ට අවබෝධ කරන්න.
    - ආදරය හා කරුණාව මැවිල්ල තුළින්
    - සමාවදීම තුළින්
- මිනිසාට ඒදන් උයන තුළදී දෙවියන් වහන්සේගේ පූර්ණ රැකවරණය හා ආශීර්වාදය ලැබුණ බව සිසුන්ට අවබෝධ කර දෙන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතේ අදාළ පාඩමේ මුල් පිටුවේ ඇති වගන්ති සිසුන්ට අවබෝධ කර දී ශබ්ද නඟා කියවන්න.

පියවර 3
- පහත සඳහන් චිත්‍ර සිසුන්ට ලබා දෙන්න.
- ඉවතලන දෑ තුළින් මෙම කොලාජ් චිත්‍රය සම්පූර්ණ කරවන්න.
- ආදම් හා ඒව ඒදන් උයනේ සතුටින් සිටින චිත්‍රය පාට කරවන්න.
- දෙවි පියාට තුතිදෙමින් ප්‍රතිප්‍රේමය දැක්විය යුතු ආකාරය හොඳින් පෙන්වා දෙන්න.
- ගීතාකා ගයමින් තුති දීමට මඟ පෙන්වන්න.





**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**
- දෙවි පියාණන් වහන්සේ ඒදන් උයනේ අපට මවා දී ඇති චිත්‍ර පාට කිරීමට උපදෙස් දෙන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 | ආගමික කතන්දර ඇසුරින් උතුම් ගුණාංග ප්‍රකාශ කරයි | ආගමික කතන්දර ඇසුරින් උතුම් ගුණාංගයක් ප්‍රකාශ කරයි | ආගමික කතන්දර ඇසුරින් උතුම් ගුණාංග සහය ඇතිව ප්‍රකාශ කරයි. | අආගමික කතන්දර ඇසුරින් උතුම් ගුණාංග ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 | ආදම් ඒවගේ පුතුන් දෙදෙනාව නම් කරයි. | ආදම් ඒවගේ පුතුන්ගෙන් එක් අයෙකු නම් කරයි. | තව කෙනෙකුගේ සහය ඇතිව ආදම් ඒවගේ පුතුන් දෙදෙනාව නම් කරයි. | ආදම් ඒවගේ පුතුන් දෙදෙනා නම් නොකරයි. |

# 3 සංකල්පය - සමාජීය හා සංස්කෘතික සංවේදීතාව

## දෙව් මැදුරට යමු

තම දේවස්ථානයට යාමට පෙර අවශ්‍ය දේ සූදානම් කර ගනිමින්, ගෞරවාන්විතව දේවස්ථානයට ඇතුළු වී පූජනීය ස්ථාන හඳුනා ගෙන නිවැරදිව වත්පිළිවෙත්වලට සහභාගි වී දෙවියන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්වීම මෙයින් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3. ආගමික සිද්ධස්ථාන හඳුනා ගෙන එම ස්ථානවලදී ගෞරවාන්විත ව හැසිරෙයි. | කතෝලික දෙව් මැදුරු සිද්ධස්ථාන | 3.1 තම ආගමික ස්ථානය හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 ස්ථානය හඳුනා ගැනීම |
| | | 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූලව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූලව හැසිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- දෙව් මැදුර අඩංගු පින්තූරය
- ගීතිකා පොත
- ජපමාලය
- පාට
- දෙව් මැදුරට රැගෙන යන ද්‍රව්‍ය
- පහනක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**දෙව් මැදුරට යාමට පෙර සූදානම**

(දෙව් මැදුරකට යාමට අවස්ථාවක් නොමැති නම් දෙව් මැදුර අඩංගු පින්තූරයක් පෙන්වන්න. ඉන්පසු සිසුන්ව නිදහස් තැනකට එක් කරගෙන ගොස් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.)

- විදුහල්පතිතුමා/තුමිය සමග සාකච්ඡා කර දෙව් මැදුරට යන ගමන සූදානම් කර ගන්න.
- දෙව් මැදුරට දරුවන් රැගෙන ඒම පිළිබඳ දේවස්ථානයේ ගරු පියතුමා දැනුවත් කර අවසර ලබා ගන්න.
- දරුවන් දෙව් මැදුරට රැගෙන යාම පිළිබඳ දෙමාපියන් ද දැනුවත් කරන්න.
- දෙව්මැදුරට යාමට පෙර දිනයේ දෙව්මැදුරේදී හැසිරිය යුතු ආකාරය (නිශ්ශබ්දතාවය රැක ගැනීම) ගැන දැනුවත් කරන්න.
- සුදුසු ආකාරයකට දෙව් මැදුරට පිටත්ව යන්න. (පිඩුරු පිදීම පළිබඳ හොඳින් දරුවන් දැනුවත් කරන්න.)

**දෙව් මැදුරට ගිය පසු**

**පියවර 1**

- දෙව් මැදුරට ඇතුළු වීමට පෙර ජපමාලය, ගීතිකා පොත, වේල්එක වැනි දෑ රැගෙන යන බව පවසන්න. ගුරුතුමිය ළඟ ඇති ජපමාලය, ගීතිකා පොත පෙන්වා කියා දෙන්න.
- දරුවන් පෙළ ගස්වා දෑත් වැඳ ගැනීමට උපදෙස් දෙන්න.
- දෙව් මැදුරට ඇතුළු වන විට නිශ්ශබ්දව භක්තිමත්ව ඇතුළු විය යුතු බව පහදා දෙන්න.

පියවර 2

- අල්තාරය අඩංගු පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- දෙව් මැදුර යනු දෙවියන් වහන්සේ වැඩ සිටින ස්ථානය බව පවසන්න.
- මේ නිසා අපි දෙව් මැදුර තුළදී යහළුවන් සමග කතා නොකර නිශ්ශබ්දව සිටිය යුතු බව කියන්න. දෙව් මැදුරේදී අපි දෙව් පියාණන් වහන්සේ සමග පමණක් කතා කළ යුතු බව කියා දෙන්න.
- දෙව් මැදුර තුළ ඇති විශේෂ ස්ථානයක් ලෙස අල්තාරය පෙන්වා දෙන්න.
- ගරු පියතුමා දිව්‍ය පූජාව පවත්වනු ලබන්නේ අල්තාරය මත බව කියා දෙන්න.
- අල්තාරයේ ඇති සුවිශේෂ ස්ථානයක් ලෙස, රතු පහනක් දල්වා ඇති දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තැන්පත් කර ඇති ස්ථානය සිසුන්ට පෙන්වා දෙන්න.

පියවර 3

- දැන් අපි දෙව් මැදුර තුළ වැඩ සිටින දෙව් පියාණන් වහන්සේට වැඳ නමස්කාර කරමු යැයි පවසන්න. පළමුව දෑත් එක්කර වැඳ ගැනීමට උපදෙස් දෙන්න.
- දකුණු කකුළෙහි දණහිස බිම තබා හිස පහත් කර වැඳ නමස්කාර කරන අයුරු ගුරුතුමිය ආදර්ශනය කර පෙන්වන්න.
- පසුව සිසුන් සමග පියවරෙන් පියවර වැඳ නමස්කාර කර සිසුන්ට වැඳ නමස්කාර කිරීමට පුහුණු කරන්න.

පියවර 4

- සිසුන් කුරුසය පාමුලට රැගෙන යන්න. දණ ගසා දෑත් වැඳ ගැනීමට පවසන්න.
- "ජේසු රජාණෙනී ඔබ වටලා" ගීතිකාව දරුවන් සමග භක්තිමත්ව ගායනා කරන්න. සිසුන් නැගිටුවන්න.
- දෙව් මැදුර තුළ ඇති බංකු මත සන්සුන්ව පරතරයක් ඇතිව වාඩි කරවන්න.
- දෙව් පියාණන් වහන්සේ සමග සුළු මොහොතක් නිහඬව කතා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් විසින් කිවයුතු ස්තුති කිරීම්, ඉල්ලීම් වැනි දේ ගුරුතුමිය මතක් කර දෙන්න.

පියවර 5

- සන්සුන්ව සිසුන් දේවස්ථානයෙන් පිටතට ගෙන යන්න.
- දේවස්ථානය තුළදී දුටු දේවල් පිළිබඳ කතා බහ කරන්න.
- දේවස්ථානයෙන් පිට වීමට පෙර භාවිත කළ බංකු නැවත පිළිවෙළට සකස් කිරීමටත්, දේවස්ථාන භූමිය පවිත්‍ර කිරීමටත් සිසුන් යොමු කරන්න.
- රැගෙන ආ දේවල් නැවත රැගෙන යාමට උපදෙස් දෙන්න.

**දෙව් මැදුරට ගොස් ආ පසු**

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස්:**

- අපේ දෙව් මැදුර රූප සටහන ලස්සනට පාට කරවන්න.
- දෙව් මැදුරට යන විට රැගෙන යන දේවල් යා කරන්න.
- දෙව් මැදුර තුළ විශේෂ ස්ථානයක් ලෙස හඳුනා ගත් අල්තාරය සහිත රූපය සිසුන්ට පෙන්වා එහි වැදගත්කම ඉස්මතු කරන්න.
- දෙව් මැදුරට ගොස් ගෞරවාන්විතව හැසුරුනු ආකාරය නැවත මතක් කරන්න.
- සිසුන් හා එක්ව "ජේසු රජාණෙනි" ගීතිකාව ගායනා කරන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතේ අඩංගු පින්තූරය දෙස බලා ඉරු දින දෙව් මැදුරට යා යුතු මග නිවැරදි ව පාට කරවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 3.1 තම ආගමික ස්ථානය හඳුනා ගෙන නම් කරයි. | 3.1.1<br>3.1.2 | දෙව්මැදුර තම ආගමික ස්ථානය ලෙස හඳුනා ගෙන නම් කරයි. | තම ආගමික ස්ථානය හඳුනා ගැනීමේ දුෂ්කරතා දක්වයි. |
| 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 | නිවැරදි ඉරියවු භාවිත කරමින් දෙව් පියාණන් වහන්සේට වැඳ නමස්කාර කරයි. | නිවැරදි ඉරියවු භාවිත කරමින් දෙව් පියාණන් වහන්සේට වැඳ නමස්කාර කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 4 සංකල්පය - සමාජීය හා සංස්කෘතික සංවේදීතාව
## සිරි කුරුසිය

**සංස්කෘතික සංවේදිතාව ඉස්මතු කර ගනිමින් ශ්‍රී කුරුසියට ගෞරව කරන ආකාරයත් කිතුනු සංස්කෘතියේ සංකේතය වන ශ්‍රී කුරුසිය අර්ථවත්ව පැළඳීමත් සංස්කෘතික උත්සවවලට ගෞරවාන්විත ව සහභාගී වීමත් මෙයින් අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | සංකේත | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරීව සහභාගී වෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගී වීම |
| | | 4.3 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.1 ක්‍රියාකාරකම්වල නිරත වීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශ්‍රී කුරුසියේ ප්‍රතිමාව/ශ්‍රී කුරුසියේ චිත්‍ර
- කුඩා කුරුසියක්/කුරුසිය පැලඳීමට අවශ්‍ය කොරදම් පටි
- ගීතිකාව අඩංගු පෝස්ටරය
- ජේසුස් වන්සේගේ කල්වාරි ගමන දැක්වෙන වීඩියෝ පටය
- ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය
- වර්ණ/වියලි ශාක පත්‍ර/ගම්
- කුඩාවට ඉරාගත් පාට කඩදාසි
- මාරවිල සිද්ධස්ථානය පිළිබඳ වීඩියෝ පටය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** 1

පියවර 1

- මාරවිල සිද්ධස්ථානය පිළිබඳ වීඩියෝ පටය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. එහි අන්තර්ගතය පැහැදිලි කරන්න.
- මෙම කුරුසයේ ප්‍රතිමාව තුළ අඩංගු විශේෂ ලක්ෂණ සිසුන්ට පහදන්න.
- ශ්‍රී කුරුසියේ ප්‍රතිමාව/ශ්‍රී කුරුසියේ පින්තූරය ඉතාම ගෞරවයෙන් සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරවන්න.
- මෙම ප්‍රතිමාව කුමක් ද යන්න සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්න.
- ජේසුස් වහන්සේගේ ශ්‍රී කුරුසිය ගැන සිසුන්ට අවබෝධ කර දෙන්න.
- ශ්‍රී කුරුසිය කිතුනු අපේ උතුම් ලාංඡනය බව සිසුන්ට වටහා දෙන්න.
- කිතුනු අපට ගැලවීම අත්කර දුන් ශ්‍රී කුරුසියට ගෞරව කළ යුතු ආකාරය සිසුන්ට අවබෝධ කර දෙන්න.
- "බලව් බලව් කුරුසේ" ගීතිකාව ලියූ පෝස්ටරය ප්‍රදර්ශනය කරවන්න.
- එහි වචන හා අර්ථය සිසුන්ට පහදා දෙන්න.
- සිසුන්ට ගීතිකාව ශ්‍රවණය කිරීමටද අවස්ථාව ලබා දෙන්න.
- දෑත් වැද ඉතා ගෞරවාන්විතව ගීතිකාව සිසුන් හා එක්ව ගායනා කරවන්න.

පියවර 2

- ජේසුස් වන්සේගේ කල්වාරි ගමන දැක්වෙන වීඩියෝ පටය ප්‍රදර්ශණය කරන්න.
- පාස්කු සමයේ භක්ති අභ්‍යාස පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. එම අද්දකීම් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

- සිසු ක්‍රියාකාරකම් පොතේ අඩංගු චිත්‍රය දෙස සිසු අවධානය යොමු කරවන්න.
- චිත්‍රය පිළිබඳ අදහස් මතු කර ගන්න.
- සිසු අදහස් අගය කරන්න.
- එහි අඩංගු කරුණු ශබ්ද නගා වචනයෙන් වචනය සිසුන් සමග  කියවන්න.
- ජේසුස් වහන්සේ මරණය පරදා ජය අපට ලබා දුන් සංකේතය ශ්‍රී කුරුසිය බව සිසුන්ට තහවුරු කරන්න.
- චාතරික සමය තුළ ලබා ගත් අද්දැකීම් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

පියවර 3

- පාස්කු කාලය හා භක්ති අභ්‍යාස පිළිබඳ සැකෙවින් අවබෝධ කරවන්න.
- හොඳ වැඩ/ යහපත් ක්‍රියා මොනවාදැයි සිසුන්ගෙන් විමසන්න.
- දෛනික ව සිසුන් කරන හොඳ වැඩ විමසා කළු ලැල්ලේ සටහන් කරන්න.

  උදා. - මම පාස්කු සමය තුළ පල්ලි ගියා.
  මම ගීතිකා ගායනා කළා.
  මම අම්මාට උදවු කළා.
  මම ගුරුවරුන්ට කීකරු වුණා.
  මම ගේ අතු ගෑවා.
  මම කෝප්පය සේදුවා.

- සිසු පිළිතුරු අගය කරන්න.
- හැකි පමණ වියළි ශාක පත්‍ර යොදා ගනිමින් කුරුස නිර්මාණය කරවන්න.
- ඔබ යහපත් වැඩක් කිරීමෙන් පසුව නිර්මාණය කර ගත් කුරුස සිසු නිර්මාණ පුවරුවේ අලවන්න. එහිදී විවිධ රටා අනුව සිසු නිර්මාණශීලීත්වය ගොඩනැංවෙන අයුරින් එම කුරුස ඇලවීමට උපදෙස් දෙන්න.

පියවර 4

- රැගෙන ආ කුඩා කුරුස හා කොරදම් පටි ගුරු මේසය මත තබන්න සිසුන් යොමු කරන්න. (අන් අය අතරද බෙදා ගත හැකි වන සේ වැඩිපුර කුරුස හා කොරදම් පටි ගෙනෙන්නට සිසුන් දැනුවත් කරන්න.)
- පන්තියේ සියලු ම සිසුන් අතර කොරදම් පටි හා කුරුස බෙදා දෙන්න.
- කුරුසිය කොරදම් පටියේ රඳවා තම ගෙලේ පලඳා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. (සිසුන්ට ගුරු සහාය ලබා දෙන්න.)
- ශ්‍රී කුරුසිය ගෙල පැලඳීමෙන් තමා දේව වරප්‍රසාදයෙන් බලවත් වන බව සිසුන්ව අවධාරණය කරවන්න.
- අපගේ කිතුනු බවේ සංකේතය වන කුරුසියට අප ආදරයෙන් ගෞරව කළ යුතු බව සිසුන්ට අවබෝධ කර දෙන්න.
- ආභරණයක් ලෙස නොව ඉතා ම ගෞරවයෙන් කුරුසිය කර පලඳා ගත යුතු බව අවබෝධ කරවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස්:**

- ක්‍රියාකරකම් පොතේ අඩංගු ජේසු සමිඳුන් කුරුසිපත් චිත්‍රය දෙස බලා සිසු අදහස් විමසන්න.
- ජේසුස් වහන්සේගේ කල්වාරි ගමන අඩංගු වීඩියෝ පටයක් නැරඹීම මඟින් පින්තූරය පිළිබඳ අවබෝධ කරවන්න.
- සිරි කුරුසිය කිතුනුවන්ගේ ජයග්‍රාහී සංකේතයක් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- කුරුසියේ ලකුණ කොලාජ් ක්‍රමයට යොදා ගනිමින් සම්පූර්ණ කරවන්න.
- ක්‍රියාකරකම් පොතේ අඩංගු චිත්‍රය ලස්සනට පාට කරවන්න.

තක්සේරු කිරීම :

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවයට දුරස්ථය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගී වෙයි. | 4.1.1 | සංස්කෘතික සංවේදිතාව ඉස්මතු කෙරෙන ශ්‍රී කුරුසියේ සංකේතයට ගෞරව කරයි. | සංස්කෘතික සංවේදීතාව ඉස්මතු කෙරෙන ශ්‍රී කුරුසියේ සංකේතයට ගෞරව කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.3 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.1 | සුවිශේෂ ආගමික උත්සවයක් ආදර්ශනය කර ගනිමින් ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | සුවිශේෂ ආගමික උත්සවයක් ආදර්ශනය කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 5 සංකල්පය - ආචාර ධර්ම සාරධර්ම හා සම්මතයන්

## ශාන්ත කුරුසය අඳිමු

කිතුනු වන්දනාමාන හා වත්පිළිවෙත් අනුසාර කරමින් මෙම නිල යාච්ඤාව හඳුන්වා දීමත්, සාන්ත කුරුසිය සලකුණු කිරීමත් පූජනීය ස්ථානවලදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීමත් මෙයින් අපේක්ෂා කෙරේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5. පූජනීය ස්ථානවලදී නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් අනුගමනය කරයි. | වන්දනා හා වත්පිළිවෙත් | 5.2 නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත්වලට අනුව කටයුතු කරයි. | 5.2.1 නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත්වලට අනුව කටයුතු කිරීම. |
| 6. ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු | 6.3 ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශ්‍රී කුරුසයේ ප්‍රතිමාව
- පාට කඩදාසි, ගම්
- පාට පැන්සල්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** 1

**පියවර** 1

- නිහඬ පරිසරයකට සිසුන් රැගෙන යන්න.
- යාච්ඤාව අඩංගු පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- පින්තූරය දෙස බලා සිසු අදහස් ප්‍රකාශ කිරීමට මග පාදන්න.
- ජේසුස් වහන්සේගේ ශ්‍රී කුරුසිය කිතුනු අපගේ උතුම් ලාංඡනය බව නැවත මතක් කර දෙන්න.
- "සාන්ත කුරුසයේ යැදුම" අවස්ථාවේදී මෙම ශුද්ධ වූ කුරුසයේ ලකුණ අප ශරීරය මත සලකුණු කර ගන්නා බව කියා දෙන්න.
- සාන්ත කුරුසියේ යැදුම ඉතාම බලවත් යැදුමක් බව ප්‍රකාශ කරන්න.
- මෙම යැදුම භාවිත කරන අවස්ථා පහදන්න.

**පියවර** 2

- සිසුන් නැගිටුවා සන්සුන් කර පන්ති කාමර පරිසරය යාච්ඤාව සඳහා සුදුසු ලෙස සකසා ගන්න.
- සියලු සිසුන්ට දෑත් වැඳ ගැනීමට පවසන්න.
- පහත උපදෙස් ගුරුතුමිය සිසුන්ට පවසන්න. ආදර්ශනය කර පෙන්වන්න.
- දකුණත මදක් ඉදිරියට ගෙන මහපටැඟිල්ල කෙළින් කර අනෙක් ඇඟිලි මිට මොලවා ගන්න.

1. මහපටැඟිල්ලෙන් පළමුව නළල මත කුරුසය සලකුණු කරන්න.
   ''සාන්ත කුරුසේ අඩයාලමෙන්" පවසන්න.
2. දෙතොල මත කුරුසය සලකුණු කරන්න.
   ''අපේ සතුරන්ගෙන් අප ගළවා දේවා" ප්‍රකාශ කරන්න.
3. පපුව මත කුරුසය සලකුණු කරන්න.
   ''අපගේ දෙවි ස්වාමිනී" පවසන්න.
4. නළල, පපුව, වම් හා දකුණු උරහිසට පිළිවෙළින් සලකුණු කරන්න.
   ''පිතාගෙත්, පුත්‍රයාගෙත්, ස්ප්‍රීතු සාන්තුගෙත් නාමයෙන්" පවසන්න.
5. දෑත් එක්කර, හිස පහත් කර වැඳ "ආමෙන්" ප්‍රකාශ කරන්න

- මෙලෙස නිවැරදි සලකුණු කිරීම සමගින් "සාන්ත කුරුසයේ" යැදුම ගුරුතුමිය සිසුන් සමග කිහිපවරක් උච්චාරණය කරන්න.
- අපගේ කිතුනු බවේ සංකේතය වන කුරුසයට අප ආදරයෙන් ගෞරව කළ යුතු බව සිසුන්ට නැවත අවබෝධ කර දෙන්න.

පියවර 3
- නිවසින් බැහැර වන විට මෙම යැදුම උච්චාරණය කරන බව හොඳින් අවබෝධ කරවන්න.
- සැම යාච්ඤාවකටම පෙර මෙම යාච්ඤාව උච්චාරණය කළ යුතු බව පසක් කරවන්න.
- පෙර කියා දුන් සාන්ත කුරුසියේ යාච්ඤාව නැවතත් ගෞරවාන්විතව උච්චාරණය කරවන්න.
- නිවැරදි ව මෙම නිල යාච්ඤාව උච්චාරණය කරන සිසුන්ව ඉදිරියට කැඳවන්න. ඉන්පසු ඔවුන් ලවා නැවතත් එම නිල යාච්ඤාව නිවැරදි ඉරියවු භාවිත කරමින් ගෞරවාන්විතව උච්චාරණය කරවන්න.
- අත්පොළසන් දී සිසුන්ව අගය කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස්:**
- සාන්ත කුරුසියේ ලකුණ බැතියෙන් නිවැරදි ව සලකුණු කරන්න. ඉන් පසු එම චිත්‍ර පාට කරවන්න.
- නිවැරදි ව කුරුසියේ ලකුණ සලකුණු කරන අනුපිළිවෙළ අනුව ගැළපෙන ඉලක්කම යා කරන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවයට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 5.2 නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත්වලට අනුව කටයුතු කරයි. | 5.2.1 | බැතියෙන් සාන්ත කුරුසිය යැදුම සලකුණු කරමින් උච්චාරණය කරයි. | බැතියෙන් සාන්ත කුරුසිය යැදුම සලකුණු කරයි. පැහැදිලිව උච්චාරණය නොකරයි. | සාන්ත කුරුසිය යැදුම සහය ඇතිව බැතියෙන් සලකුණු කරමින් උච්චාරණය කරයි. | සාන්ත කුරුසිය යැදුම සලකුණු කිරීමට, පැහැදිලිව උච්චාරණය කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 6.3 ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 | ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරන අන්දම ප්‍රකාශ කරයි. | ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරන අන්දම තරමක් දුරට ප්‍රකාශ කරයි. | ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරන අන්දම සහය ඇතිව ප්‍රකාශ කරයි. | ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීමට දුෂ්කරතා දක්වයි. |

# 6 සංකල්පය - සතිමත්බව, සෞඛ්‍යය හා යහපැවැත්ම

## සතිමත්ව ඇවිදිමු

සිත එක් තැන් කර ගනිමින් සතිමත්ව ඇවිදීමට හුරුවක් ලබා දීම තුළින් දෛනික කටයුතු ජේසු සමිඳුන් තුළ නිවරැදි ව ඉටු කිරීමට මග පෙන්වීමක් ලබා දීම මෙම පාඩමේ අපේක්ෂාවයි.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 11. දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතුව කටයුතු කරයි. | යහපත් දින චර්යාව හා සතිමත් බව | 11.1 ඇවිදීමේදී මනා සිහියෙන් යුතුව ඇවිදියි. | 11.1.1 සිහියෙන් ඇවිදීම |
| | | 11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රලු - සිනිඳු, තෙත - වියළි, උණුසුම - සිසිල් බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 රළු - සිනිඳු, තෙත - වියළි, උණුසුම - සිසිල් බව හඳුනා ගැනීම |

**ඉගෙනුම් සම්පත් :**

- නමෝ නමෝ නමෝ වඳිමු ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය
- චිත්‍ර පාට කිරීමට අවශ්‍ය වර්ණ
- ජේසු සමිඳුන්ගේ ප්‍රතිමාව/ පින්තූරය
- ස්වභාවික මල්, වට්ටිය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**
**පියවර 1**

- නිදහස් එළිමහන් ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- සිසුන් අතර දුරස්ථභාවයක් තබා ගනිමින් ස්ථානගත කරන්න.
- සිත එක්තැන් කර ගනිමින් ගීතිකාවට සවන් දෙන්න. ඉන්පසු ''නමෝ නමෝ නමෝ වඳිමු'' ගීතිකාවට සවන් දී රග දක්වමින් ගායනා කරවන්න.
- සුළු භාවනාවක් තුළින් සිත එක්තැන් කර ගත් පසු මෙම ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
- සියලු සිසුන්ගෙන් මෙය විමසන්න.
- ඔබ ගායනා කළ ගීතිකාව කුමක් ද? ඉන් අදහස් කරන්නේ කුමක් ද?
- ඔබේ සිත කය දෙවිඳුන්ට භාර දුන්න ද?
- තවත් මෙවැනි ප්‍රශ්න යොදා ගනිමින් සිසු අවධානය යොමු කර ගන්නට උත්සාහ කරන්න.
- මෙම ප්‍රශ්නාවලිය තුළින් සිසු අවධානය ඔබ වෙත යොමු කර ගන්න.

**පියවර 2**

- තම සපත්තු මේස් ගලවා පිළිවෙළකට එක් ස්ථානයක තබන්නට සිසුන් යොමු කරන්න.
  - ඔබ සිට ගෙන සිටින බව දන්නවා ද?
  - ඔබගේ ශරීරයේ බර පාදවලට දැනෙනවා ද?
  - ඔබ සිටගෙන සිටින විට පාදවලට දැනෙන්නේ මොනවා ද?
  - ඔබගේ යටිපතුල්වලට දැනෙන ස්පර්ශය කෙසේ ද?
  - රළු බව සිනිඳු බව උණුසුම දැනෙනවා ද?
  - ඔබගේ කොන්ද කෙළින් බව දැනෙනවා ද?

- තෝරාගත් ස්ථානයේ එහා මෙහා ඇවිදින්නට සිසුන් යොමු කරවන්න. පසුව ඇවිදින වේගය වැඩි කරන්න.
- වම් කකුල තබන විට වම් කකුලටත් දකුණු කකුල තබන විට දකුණු කකුලටත් ස්පර්ශය දැනෙනවා ද යන්න සිසුන්ගෙන් විමසන්න.
- ස්පර්ශයේදී දැනෙන සීතල බව උණුසුම් බව රළු බව සිනිඳු බව කෙරෙහි අවධානය යොමු කරමින් ඒවා මෙනෙහි කරමින් ඇවිදින්නට සිසුන් යොමු කරන්න.

පියවර 3
- සතිමත් ව ඇවිදිමින් තමන් ලද අද්දැකීම එකිනෙකාගෙන් විමසන්න.
- සැම සිසුවෙකුට ම තම අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- සතිමත්බවෙන් ලැබෙන ප්‍රයෝජන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- නිරෝගීමත් ජීවිතයකට සතිමත් ව ඇවිදීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ සිසුන් ව දැනුවත් කරන්න.
- කුඩා කළ සිට ම සතිමත් ව කටයුතු කළ යුතු බව සිසුන්ට වටහා දෙන්න.
- සිසුන් සමග යහපත් සිතුවිලි පිළිබඳ ව සංවාදයක යෙදෙන්න.
- ජේසුස් වහන්සේගේ ආදරය කරුණාව දයාව වැනි ගුණාංග ඉස්මතු කර දක්වන්න.
- පාසල, ගෙදර තුළ ආදරය කරුණාව යොදා ගත හැකි ආකාර පිළිබඳව සිසුන් සමග අදහස් හුවමාරු කරගන්න.
- පහත කවි පෙළ සිසුන් සමග තාලයට ගායනා කරන්න.
  **ජේසුනි මගේ දෙපා ඔබට බාරයි**
  **ජේසුනි මගේ දෙපා ඔබට බාරයි**
- අත් දෙක ඔසවා සිසුන් සමග ගායනා කරන්න.
  **ජේසුනි මගේ අත් ඔබට බාරයි**
  **ජේසුනි මගේ අත් ඔබට බාරයි**
- තමන්ගේ පාවහන් පැලඳ පිළිවෙළකට සිසුන්ව පන්ති කාමරයට රැගෙන යන්න.

පියවර 4
- ජේසුස් වහන්සේ වගේ වෙන්න අපි මොක ද කරන්නේ?
- සිසු අදහස් තුළින් පහත සංකල්ප ඉස්මතු කර ගන්න.
  - අන් අයට ආදරය කිරීම
  - අන් අය සමග බෙදා ගැනීම
  - සැම විටම කරුණාව දැක්වීම
  - අපි ආදරය කළ යුත්තේ කාට ද?
  - විශේෂයෙන් අපගේ ආදරය බලාපොරොත්තු වන්නේ කවුරුන් ද?
  - අපි අන් අය සමග බෙදා ගත් යුත්තේ මොනවා ද?
  - අපි අන් අය සමග බෙදා ගන්නේ කොහොම ද?
  - ජේසුස් වහන්සේ ආදරය කළේ කාට ද?
  - ජේසුස් වහන්සේ කරුණාව දැක්වූයේ කාට ද?
- සිසු අදහස් විමසන්න. සිසු අදහස් අගය කරන්න.
- ආදරය, කරුණාව, බෙදා ගැනීම ඇති තැන දෙවියන් වහන්සේ වැඩ සිටින බව සිසුන්ට ඒත්තු ගන්වන්න.
- අපි දෙවියන් වහන්සේගේ නාමයෙන් රැස් වී සිටින කල දෙවියන් වහන්සේ අප තුළ වැඩ සිටින බව සිසුන්ට අවබෝධ කරවන්න.
- සිසුන් සන්සුන් කරවා පහත කවි පෙළ තාලයට ගායනා කරන්නට අවස්ථාව ලබා දෙන්න.
  **මගේ සිත තැන්පත් ය තැන්පත් ය තැන්පත් ය**
  **මගේ සිත පිරිසිදු ය පිරිසිදු ය පිරිසිදු ය**
  **මගේ සිත සන්සුන් ය සන්සුන් ය සන්සුන් ය**
  **මගේ සිත පිරිසිදු ය තැන්පත් ය සන්සුන් ය**

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස්:**

- භාරගන්න සමිඳුනේ ගීතිකාව ගායනා කරවන්න.
- සිසුන් සතිමත් ව ඇවිදින  චිත්‍රය පාට කරවන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතේ කවි තාලෙට සිසුන් සමග ගායනා කරන්න.
- මල් පාට කිරීමට උපදෙස් දෙන්න.
- සිත එකඟ කරගෙන තමා රැගෙන ආ මල ජේසු සමිඳුන්ගේ ප්‍රතිමාව/ පින්තූර ඉදිරියෙන් තබන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 11.1. ඇවිදීමේදී මනා සිහියෙන් යුතුව ඇවිදියි. | 11.1.1 | නිවැරදි ඉරියවු යොදා ගනිමින් සතිමත් ව ගමන් කරයි. | නිවැරදි ඉරියවු යොදා ගනිමින් සතිමත්ව ගමන් කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 11.2 ඇවිදීමේදී යටිපතුලට දැනෙන රළු සිනිඳු තෙත වියළි උණුසුම් සිසිල් බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 | ඇවිදීමේදි යටි පතුළට දැනෙන දේ ප්‍රකාශ කරයි. | ඇවිදීමේදි යටි පතුළට දැනෙන දේ ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# අන්තර්ගතය
## දෙවන වාරය


| | |
|---|---|
| 1. අපේ උතුම් ම පොත ශුද්ධ බයිබලයයි | 19 |
| 2. තලවිල සාන්ත ආනා දෙව්මැදුර | 21 |
| 3. නිවසේදී දෙවි සමිඳුන් හමුවෙමු | 23 |
| 4. ශුද්ධ වූ පවුලයි අපේ පවුලයි | 26 |
| 5 ගුරු උතුමන් නමදිමු | 29 |
| 6. සහයෝගයෙන් වැඩ කරමු | 32 |

# 1 සංකල්පය - චරිත සංවර්ධනය
# අපේ උතුම් ම පොත ශුද්ධ බයිබලයයි

ශුද්ධ බයිබලය තුළ අඩංගු දේව වචනය අවබෝධ කරගෙන ආගමික පාඨ හොඳින් වටහා ගෙන දේව වචනයට සවන් දී ගරු කරමින්, තම ජීවිතය අර්ථවත් කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම් වාග් මාලාව සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ සංකල්පය හඳුනා ගනියි. | දෙවි පියාණන් වහන්සේ | 1.4 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.4.2 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කිරීම |
| 2. ආගමික ශාස්තෲවරයා/ නිර්මාතෲවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | දෙවි පියාණන් වහන්සේ ගේ ශ්‍රී වචනය | 2.4 උපදේශ කාව්‍යකට සවන් දී කාව්‍යය තාලයට ගායනා කරයි. | 2.4.2 තාලයට ගායනා කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය (ශු.ලූක් 18:15-17)
- සුදු රෙද්ද, මල්, පහන්, ගිනිපෙට්ටිය, ඉටිපන්දම්
- කිතුනු ගී පොත (37 ගීතිකාව)
- යාච්ඤාව ඇතුළත් පෝස්ටරය
- සිසු ක්‍රියාකාරකම් පොතේ වගන්ති සහිත පෝස්ටරය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- ශුද්ධ බයිබලය ගෞරවාන්විත ව තැම්පත් කිරීම සඳහා සුදුසු ස්ථානයක් සකස් කර තබන්න.
- ගීතිකාව අඩංගු පෝස්ටරය පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- ගුරුතුමිය ශුද්ධ බයිබලය ඉතා ගෞරවාන්විත ව පෙරහැරෙන් ගෙන ගොස් සිපාචාර කර සකස් කරන ලද ස්ථානයේ තබන්න. පෙර දැනුම් දුන් පරිදි මල් ඉටිපහන් (දැල්වූ) රැගත් දරුවන් ගුරුතුමිය පිටුපසින් සන්සුන් ව පැමිණ, සකස් කරන ලද ස්ථානයේ ඒවා තබන්න. පෙරහැරක් මෙන් "අදහමි මගේ සමිඳුනේ" ගීතිකාව ගයමින් සන්සුන්ව සියලු දෙනා පැමිණිය යුතු ය.
- ශුද්ධ බයිබලයේ ශු.ලූක් 18:15-17 සිසුන්ට ඇසෙන සේ ශබ්ද නඟා කියවන්න. (ළදරුවන් මා වෙතට එන්න ඉඩ දෙන්නට ඉඩ දෙන්න.)
- කියවිය හැකි සිසුන් සිටී නම් එම සිසුවා හෝ සිසුවියට ද මෙම ශුද්ධ ලියවිලි පාඨය ඉතා ගෞරවාන්විත ව කියවීමට උපදෙස් දෙන්න.
- සිසුන්ට ශුද්ධ ලියවිලි පාඨයේ අර්ථය වටහා දෙන්න. දේව වචනය නිතර සවන් දීමට සිසුන්ව යොමු කරන්න.
- යාච්ඤාව අඩංගු පහත පෝස්ටරය සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- දැත් වැඳ භක්තිමත් ව මෙම යාච්ඤාව සිසුන් හා එක්ව උච්චාරණය කරන්න.

**ආදර ජේසුනී, දේව වචනය තුළින් අපට කතා කරන ඔබ වහන්සේට ගොඩක් ස්තුතියි. ආමෙන්**

පියවර 2
- දේව වචනය අඩංගු ශුද්ධ බයිබලය කිතුනු අපේ උතුම් ම ග්‍රන්ථය බව සිසුන්ට වටහා දෙන්න.
- දේව වචනය තුළින් අපේ ජීවිත ආලෝකමත් වන ආකාරය සිසුන්ට හොඳින් පහදා දෙන්න.
- ඉටිපහන් දැල්වීමේ අරුත සිසුන්ට පහදා දී ක්‍රියාකාරකම් පොතට අනුව ඉටිපන්දම් පාට කරවන්න.

පියවර 3
- සිසු ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම් 2 හා 3 හි ඇති වගන්ති සිසුන් සමග කියවන්න.
- එම වගන්ති ශබ්ද නඟා අවබෝධයෙන් සිසුන් හා එක්ව කියවන්න.
- කියවිය හැකි සිසුන් ඉදිරියට කැඳවා ශබ්ද නඟා කියවන්න.
- මේ ආකාරයට සිසුන් වඩාත් කැමති වගන්තිය තෝරා ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**
- දේව වචනයට ගරු කරමින් ඉටි පහන් පාට කරවන්න.
- ශුද්ධ බයිබලයේ ඇතුළත් වගන්ති සිසුන් සමග ශබ්ද නඟා කියවන්න.
- අදහම් මගේ සමිඳුනේ ගීතිකාව අර්ථවත්ව ගායනා කරන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 1.4 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.4.2 | දේව වචනයට ගරු කරන ආදර්ශ පාඨ භාවිත කරයි. | දේව වචනයට ගරු කරන ආදර්ශ පාඨ තරමක් දුරට භාවිත කරයි. | දේව වචනයට ගරු කරන ආදර්ශ පාඨ ගුරු සහය ඇතිව භාවිත කරයි. | දේව වචනයට ගරු කරන ආදර්ශ පාඨ භාවිතයට දුශකරතා පෙන්වයි. |
| 2.4 උපදේශ කාව්‍යයට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.2 | තාලයට ගායනා කරයි. | තාලයට තරමක් දුරට ගායනා කරයි. | තාලයට ගුරු සහය ඇතිව ගායනා කරයි. | තාලයට ගායනා කිරීමට දුශකරතා පෙන්වයි. |

# 2

## සංකල්පය - සමාජීය හා සංස්කෘතික සංවේදීතාව

# තලවිල සාන්ත ආනා දෙව්මැදුර

**උතුම් වන්දනා ස්ථානයක් වන සාන්ත ආනා දෙව්මැදුර පිහිටි ස්ථානය හා අවට පරිසරය පිළිබඳ අවබෝධ කරගෙන ගෞරවාන්විතව හා බැතියෙන් වන්දනා ගමන්වලට සහභාගි වෙමින් අධ්‍යාත්මික පෝෂණය ලබා දීම මෙහි අරමුණ වේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3. ආගමික සිද්ධස්ථාන හඳුනා ගෙන එම ස්ථානවලදී ගෞරවාන්විත ව හැසිරෙයි. | කතෝලික දෙව් මැදුරු/ සිද්ධස්ථාන | 3.2 ආගමික සිද්ධස්ථාන වලදී ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූල ව හැසිරෙයි |
| 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | කතෝලික දෙව් මැදුරු/ සිද්ධස්ථාන | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගි වීම |

**ඉගෙනුම් සම්පත් :**

- සාන්ත ආනා දෙව්මැදුර හා සාන්ත ආනා තුමිය හා ජෝකීනු තුමා අඩංගු චිත්‍ර
- සාන්ත ආනා මෑණියනේ ගීතිකාව සහිත සී.ඩී. තැටිය
- රංගනයට අවශ්‍ය ඇඳුම් පැලඳුම් හා උපකරණ
- ජපමාලය
- බාගත කර ගත් තලවිල සිද්ධස්ථානය හා සම්බන්ධ වීඩියෝ දර්ශන
- සාන්ත ආනා මුනිතුමියට කැපකර ඇති වෙනත් දේවස්ථානවල පින්තූර

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- සියලු ම සිසුන් එක්රැස් කර සාන්ත ආනා මෑණියනේ ගීතිකාව ශ්‍රවණය කරවන්න.
- ශ්‍රවණය කරන ලද ගීතිකාවේ අර්ථය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- සියලු ම සිසුන් ලවා නිවැරදි ඉරියව්වෙන් යුතුව එම ගීතිකාව ගායනා කරවන්න.

පියවර 2

- තලවිල දෙව්මැදුරේ පින්තූරය හෝ බාගත කර ගත් වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කරන්න.
- මෙම සිද්ධස්ථානය පිළිබඳ තොරතුරු සංවාදශීලී ව ඉදිරිපත් කරන්න.

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- මෙම සිද්ධස්ථානය පිහිටා ඇත්තේ තලවිල ප්‍රදේශයේ ය.
- එම පරිසරයේ සුන්දරත්වය පිළිබඳ කරුණු සිසුන්හට පැහැදිලි කර දෙන්න.
  උදාඃ මුහුදු වෙරළ
- සාන්තා ආනා මෑණියන් හා ජෝකීනු මුනිතුමා අඩංගු චිත්‍රයක් ප්‍රදර්ශනය කරන්න. ඔවුන් පිළිබඳ කරුණු දරුවන්ට පවසන්න.
- සාන්ත ආනා තුමිය ජේසු සමිඳුන්ගේ මිත්තණිය බවත් මරිය තුමියගේ මව බවත් දරුවන්ට පැහැදිලි කරන්න.

පියවර 3

- චරිත නිරූපණය සඳහා තෝරා ගත් සිසුන් දැනුවත් කරන්න.
- පෙර දැනුම් දුන් පරිදි තම චරිතයට සුදුසු ඇඳුම් හා උපකරණ යොදා ගනිමින් වන්දනා ගමනක් යන ආකාරය රංගනයේ යෙදෙන්න. වන්දනා ගමනේ යෙදෙන විට භාවිත කළ යුතු වචන පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. ඒ සඳහා පහත සඳහන් ශීර්ෂ උපයෝගී කර ගන්න.
    - රියදුරා අසුනේ වාඩි වීම
    - නඩේ ගුරා සිසුන්ව අසුන් මත වාඩි කරවීම
    - කොන්දොස්තර ගමන පිටත් වීමට සංඥා දීම
    - ගුරුතුමිය රැගෙන ආ ජපමාල යොදා ගනිමින් ජපමාලය උච්චාරණය කිරීමට සිසුන් යොමු කිරීම
    - ගීතිකා ගයමින් යාච්ඤා කරමින් බැතියෙන් යුතුව වන්දනා ගමනට සහභාගි වීම
    - වන්දනා ස්ථානවලදී ආගමානුකූල ව හැසිරිය යුතු ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
    - බස්රථයෙන් බැස දේවස්ථානයට පිවිසීම
    - එකමුතුවී යාච්ඤා කොට සාන්ත ආනා මෑණියනේ ගීතිකාව ගායනා කිරීම
    - දේවස්ථානය අවට සුන්දර පරිසරයට රැගෙන යාම
    - රැගෙන ආ ආහාර වැළඳීම හා ඉන්පසු පරිසරය පිරිසිදු කිරීම
    - බස් රථයට නැග දෙවිඳුන්ට තුති දෙමින් පාසලට පැමිණීම.
- රංගනයේ යෙදුනු වන්දනා ගමන පිළිබඳ තොරතුරු සිසුන්ගෙන් විමසා කළු ලෑල්ලේ සටහන් කරන්න. සිසුන් ඇගයීමට ලක් කරන්න.
- ක්‍රියාකාරකම් පොතේ අඩංගු පැවරුම සම්පූර්ණ කරවන්න.
- සාන්ත ආනා මුනිතුමියට කැපකරන ලද වෙනත් දේවස්ථානවල පින්තූර ප්‍රදර්ශනය කර පිහිටි ස්ථාන නම් කර යා කිරීමට සහය වන්න.

(උදා: පළගතුරේ/වත්තල/කුරණ/ජාඇල/වැලිගම්පිටිය/) තම ප්‍රදේශයට ආවේනික ස්ථාන මෙලෙස නම් කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- දී ඇති උපදෙස් පරිදි ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 1,2,3,4 කරවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූලව හැසිරෙයි. | 3.2.1 | ආගමානුකූලව හැසිරීම පිළිබඳ ප්‍රකාශ කරයි | ආගමානුකූලව හැසිරීම පිළිබඳ තරමක් ප්‍රකාශ කරයි | ආගමානුකූලව හැසිරීම ගුරු සහය ඇතිව ප්‍රකාශ කරයි | ආගමානුකූලව හැසිරීම ප්‍රකාශකිරීමට දුෂ්කරතා දක්වයි. |
| 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.1.1 | ශබ්ද නගා යාච්ඤා කරයි. | ශබ්ද නගා තරමක් දුරට යාච්ඤා කරයි. | ශබ්ද නගා ගුරු සහය ඇතිව යාච්ඤා කරයි. | ශබ්ද නගා යාච්ඤා කිරීමට දුෂ්කරතා දක්වයි. |

# 3 සංකල්පය - ආචාරධර්ම සාරධර්ම හා සම්මත

## නිවසේදී දෙවි සමිඳුන් හමුවෙමු

**පවුලේ සැම එකට එකතු වී යාච්ඤා කළ යුතු බවත්, පූජනීය ස්ථානවලට ගොස් ජේසු සමිඳුන් හමුවිය හැකි බව අවබෝධ කර ගනිමින් පවුලේ සැම එකට එක්ව නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5. පූජනීය ස්ථානවලදී නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත් අනුගමනය කරයි. | වන්දනා හා වත්පිළිවෙත් | 5.1 පූජනීය ස්ථානවලදී අනුගමනය කළ යුතු නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත් හඳුනා ගනියි. | 5.1.1 නිවැරදි වත් පිළිවෙත් ප්‍රකාශ කිරීම. |
| 6. ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියව් ප්‍රදර්ශනය කරයි. | නිවැරදි වත් පිළිවෙත් හා ඉරියව් | 6.4 ආගමික කටයුතුවලදී අදාළ වචන භාවිත කරයි. | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම. |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය - ගීතාවලිය 5;3
- දේව වචනය අඩංගු වැකිය ලියූ පත්‍රිකාව
- පවුලේ අය එක්වී යාච්ඤා කරන පින්තූරය
- ගීතිකාව ලියූ පෝස්ටරය
- "පුංචි ළමයි අපි දූතයෝ" යන ගීතිකාව අඩංගු සිඩී තැටිය
- රංගනයට අවශ්‍ය ඇඳුම්
- පාට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1 -**

- "පුංචි ළමයි අපි දූතයෝ" යන ගීතිකාව සවන්දීමට සිසුන් යොමු කරන්න.
- ගීතිකාවේ අදහස් පිළිබඳ සිසුන් හා කතාබහක යෙදෙන්න.
- රඟමින් ගීතිකාව ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ගීතිකාව හොඳින් ගායනා කරවන්න. ඉන් පසු රංගනයක යොදවන්න. පහත සඳහන් ඉතිරි පද පෙළ හොඳින් ශ්‍රවණය කිරීමට සලස්වන්න. එහි අර්ථය පහදන්න.**

පුංචි ළමයි අපි දූතයෝ රැගුමට ගැයුමට සූරයෝ
ගයන්නෙ වයන්නෙ සැමදේ කරන්නෙ
ජේසු නිසයි දම් දූතයෝ
මන්දිරය තුළ මිතුරන් අතරේ පතුරන්නෙමි දේව වචනේ
වීදියෙ මහ පාරේ දුවටී
පෙන්නන්නෙමි දෙවිඳුගෙ ප්‍රේමේ


පියවර 2

- පහත දෙබස් කියවිය හැකි සිසුන් යොදා සංවාද ස්වරූපී ව ඉදිරිපත් කරන්න.
- එක් එක් චරිතයට අංග චලන සහිතව දෙබස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- සිසු ඉදිරිපත් කිරීම් අගය කරන්න.ඒ පිළිබඳ ව සාකච්ඡාවකට සිසුන් යොමු කරන්න.
- පවුලක් ලෙස එක්වී යාච්ඤා කරන පින්තූරය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- පවුලක් ලෙස එක් වී යාච්ඤා කිරීමේ වැදගත්කම සිසුන්ට අවබෝධ කර දෙන්න.
- තම පවුලේ අය සමඟ යාච්ඤා කළ අවස්ථා ගැන සිසුන් සමග කතාබහ කරන්න.

උදා:- අපේ ආච්චී අසනීප වුණා. අපි හැමෝම එකමුතු වී යාච්ඤා කළා.
අක්කා විභාගයට ගිය දා අපි හැමෝම එක්වී යාච්ඤා කළා.
තාත්තා අලුත් රැකියාවකට ගියදා/රට ගියදා අපි හැමෝම එක් වී යාච්ඤා කළා.

- මෙසේ එක් එක් සිසුවා ලැබූ අද්දැකීම් ඉදිරිපත් කිරීමට සිසුන් පොලඹවන්න.
- පවුලේ යාච්ඤා ව තුළින් සිසුන් ලැබූ අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙව් මැදුරට ගොස් පවුලක් ලෙස යාච්ඤා කළ අවස්ථා සිසුන්ගෙන් විමසන්න.


**දෙමාපියන් හා දූ දරුවන් අතර දෙබසක්**



පියවර 3

- නිවසේදී හා දෙව් මැදුරේදී පවුලේ සැම එකට එක්වී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙන අයුරු සිසුන්ට පහදන්න.
- දේව වචන අඩංගු පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.

**සමිඳුනි , අළුයම මාගේ යැදුමට සවන් දෙනු මැනව.**
**ගීතාවලිය 5:3**



- මෙම දේව වචනය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- අවදි වූ විගස දෙවිදුන් යැදීම හොඳ පුරුද්දක් බවට පත් කරන්න.
- අලුයම යැදුම දෙවිදුන්ට ප්‍රසන්න බැවින් යාච්ඤා කළ යුතු ආකාරය පෙන්වා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ ඇති ක්‍රියාකාරකම සම්පූර්ණ කරවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ගීතිකාව ගායනා කරමින් රංගනයට යොමු කරන්න.
- පින්තූරය බලා අදහස් ප්‍රකාශ කරවන්න.
- පවුලක් ලෙස දෙවිදුන් යැදීමෙන් පසු පහත් පාට කරවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 5.1 පූජනීය ස්ථානවලදී අනුගමනය කළ යුතු නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත් හඳුනා ගනියි. | 5.1.1 | පවුලක් ලෙස යාච්ඤා කළ නිවැරදි සිරිත් විරිත් ප්‍රකාශ කරයි. | පවුලක් ලෙස යාච්ඤා කළ නිවැරදි සිරිත් විරිත් තරමක් දුරට ප්‍රකාශ කරයි. | පවුලක් ලෙස යාච්ඤා කළ නිවැරදි සිරිත් විරිත් ගුරු සහය ඇතිව ප්‍රකාශ කරයි. | පවුලක් ලෙස යාච්ඤා කළ නිවැරදි සිරිත් විරිත් ප්‍රකාශ කිරීමට දුෂ්කරතා පෙන්වයි. |
| 6.4 ආගමික කටයුතුවලදී අදාළ වචන භාවිත කරයි. | 6.4.1 | ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වචන භාවිත කරයි. | ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වචන තරමක් දුරට භාවිත කරයි. | ආගමික වතාවත් වල නිරතවීමේදී නිවැරදි වචන ගුරු සහය ඇතිව භාවිත කරයි. | ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වචන භාවිතයට දුෂ්කරතා පෙන්වයි. |

# 4
## සංකල්පය - චරිත සංවර්ධනය
# ශුද්ධ වූ පවුලයි අපේ පවුලයි

**ශුද්ධ වූ පවුල හඳුනා ගනිමින් යහපත් කිතුනු පවුලක තිබිය යුතු විශේෂ ලක්ෂණ ප්‍රකාශ කර පවුලේ සැමට ආදරය කරමින් යහපත් වචන භාවිත කරමින් ජීවිත් වන ආකාරය මෙයින් අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනියි. | කිතුනු ගුණාංග | 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කිරීම |
| | කිතුනු ගුණාංග | 2.3 ආගමික කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශ ප්‍රකාශ කරයි |

**ඉගෙනුම් සම්පත්:**
- ශුද්ධ වූ පවුලේ චිත්‍ර
- පවුලක චිත්‍රය
- කිතුනු ගී පොත ගී අංක 465
- ශුද්ධ බයිබලය - (එපීස 6 : 1)
- එපීස 6 : 1 වගන්ති ඇතුළත් පෝස්ටරය
- චිත්‍ර පාට කිරීමට අවශ්‍ය වර්ණ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**


පියවර 1
- සිසු ක්‍රියාකාරකම් පොතේ ඇති ශුද්ධ වූ පවුලේ පින්තූරය දෙසට සිසු අවධානය යොමු කර ගන්න.
- සිසුන්ගෙන් පහත ප්‍රශ්න අසන්න.
  - මේ චිත්‍රවල ඉන්න අයව ඔයාලා දන්නවා ද? ඒ කවුද? මොනවාද කරන්නේ ?

සිසු අදහස් අගයන්න.
- ජේසු සමිඳුන්ගේ සුරැකි පියාගේ නම ඔයාලා දන්නවා ද?
- ජේසු සමිඳුන්ගේ මවගේ නම දන්නවා ද?
- ජේසුස් වහන්සේගේ මවගේ, සුරැකි පියාගේ නම කිහිප වරක් උච්චාරණය කරවන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතේ ඇති දෙමාපියන්ට වැඳීමේ පින්තූරය හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙමාපියන්ට වැඳීම, ආශිර්වාදය ලබා ගැනීම ඉතා ම වැදගත් බව සිසුන්ට පසක් කරවන්න.
- පාසල් යාමට පෙර (විශේෂයෙන්)/ගමනක් යාමට පෙර දිනපතා ම දෙමාපියන්/ වැඩිහිටියන් නැමැඳ ආශිර්වාද ලබා ගැනීම ජීවන පුරුද්දක් බවට පත් කර ගත යුතු බව සිසුන්ට මනාව පසක් කර දෙන්න.
- දෙමාපියන්ට/ භාරකරුවන්ට/ තමන් සිටින ස්ථානයේ (ළමා නිවාසයේ) වැඩිහිටි පාලිකාවනට වැඳ '' ජේසු පිහිටයි'' යන ආශිර්වාදය ලබා ගැනීමේ වටිනාකම සිසුන්ට පැහැදිලි කර දෙන්න.

පියවර 2

- තමා වෙනුවෙන් මව්පියන්/ භාරකරුවන් වෙතින් වෙන සේවය අගය කරමින් ''ස්තුතියි'' යන වචනය නිතර පාවිච්චි කිරීමේ අගය වටහා දෙන්න.
- වාචිකව ප්‍රකාශ කරවන්න.

උදා: මට රසවත් කෑම උයලා දුන්නාට අම්මේ ස්තුතියි.
මට පාසල් ඒමට බෑගයක් ගෙන දුන්නාට තාත්තේ ස්තුතියි (සිසුන්ගේ පවුල් පසුබිම වටහා සිත් නොරිදෙන සේ මව්පියන් ගැන කතා කිරීමට උත්සාහ ගන්න.)



- දෙමාපියන් සිසුන්ට කළ උදවු පිළිබඳ විමසන්න.
- තම පවුල/ දෙමාපියන් සිහිකර යාච්ඤා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙමාපියන්/ භාරකරුවන් අපට කරන උපකාර පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- සිසු අදහස්වලට මුල් තැන දෙන්න.

පියවර 3

- පවුලේ සියලු දෙන, සතුටින් සිටින පින්තූරයක් පෙන්වා සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- තම නිවසේ/තමන් සිටින ස්ථානයේ (ළමා නිවාසයේ) දෙමාපියන්/ භාරකරුවන් වෙනුවෙන් කළ හැකි දේවල් රංගනයෙන් ඉදිරිපත් කිරීමටත් ශබ්ද නගා එම ක්‍රියාව පැවසීමටත් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.



උදා - ගේ අතුගෑම පෙන්වමින් - මම ගේ අතු ගානවා.
ඔළුව පීරමින් - මම තනියම ඔළුව පීරනවා.
රෙදි සෝදන බව පෙන්වමින් - මම තනියම මගේ ලේන්සුව සෝදනවා.

පියවර 4

- ''ලේ කිරි කරලා....'' ගීතිකාවට භාවනායෝගී ව සවන්දීමට සලස්වන්න.
- සිසුන්ව නැගිටවා ගෞරවාන්විත ව මෙම ගිතිකාව එක් ව ගායනා කරන්න. රඟ දක්වන්න.
- තම දෙමාපියන්/ භාරකරුවන්/ වැඩිහිටියන් පිළිබඳ අදහස් පැවසීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සිසු අදහස් අගයන්න.
- ශුද්ධ බයිබලයේ එපීස 6:1 බයිබල් පාඨය අඩංගු පෝස්ටරය සිසුන් ඉදිරියේ ශබ්ද නගා කියවන්න.

**දරුවෙනි, ඔබේ මව්පියන්ට කීකරු වන්න. එය ක්‍රිස්තියානි යුතුකම කි. එපීස 6:1**

- වචනයෙන් වචනය ඉතා ගෞරවාන්විත ව සිසුන් සමඟ කියවන්න.
- දෙමාපියන්ට කීකරු වීම, දෙවියන් වහන්සේ අපෙන් බලාපොරොත්තු බව සිසුන්ට වටහා දෙන්න.
- දෙමාපියන්ට ගරු කිරීමේ අගය සිසුන්ට පෙන්වා දෙන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- චිත්‍රය දෙස බලා වැකියන් ප්‍රකාශ කරවන්න.
- චිත්‍රය පාට කරවන්න.

තක්සේරු කිරීම :

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.2 ආගමික කතන්දර ඇසුරෙන් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 | ශුද්ධ වූ පවුල පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | ශුද්ධ වූ පවුල පිළිබඳ අදහස් තරමක් දුරට ප්‍රකාශ කරයි. | ශුද්ධ වූ පවුල පිළිබඳ අදහස් ගුරු සහය ඇති ව ප්‍රකාශ කරයි. | ශුද්ධ වූ පවුල පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.3 ආගමික කතන්දර ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | ජේසු කුමරුගෙන් ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | ජේසු කුමරුගෙන් ගත හැකි ආදර්ශයක් ප්‍රකාශ කරයි. | ජේසු කුමරුගෙන් හැකි ආදර්ශයක් ගරු සහාය ඇති ව ප්‍රකාශ කරයි. | ජේසු කුමරුගෙන් ගත හැකි ආදර්ශයක් ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |

# 5

## සංකල්පය - ආචාර ධර්ම සාරධර්ම හා සම්මතයන්

# ගුරු උතුමන් නමදිමු

**ගුරු ඔවදන් පිළිපදිමින්, ගුරුවරුන්ට කීකරු වෙමින්, ගරු කරමින්, කෘතවේදී ව ස්තුති කොට ආචාර කිරීම මගින් පිළිපැදිය යුතු සාරධර්ම හා සම්මතයන් අනුගමනය කරයි.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7. යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම/ සිරිත් විරිත් අනුගමනය කරයි. | සාරධර්ම හා සම්මතයන් | 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණ ධර්ම හඳුනා ගනියි. | 7.1.1 නිවැරදිව හඳුනා ගැනීම |
| | යහපත් දරුවෙකුගේ සිරිත් විරිත් | 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 නිවැරදිව හැසිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- බුලත්/ වත්තෙන් නෙලා ගත් මල්
- "ඇය කොණ්ඩෙ දිගට දාලා" ගීතය අඩංගු කැසට් පටිය
- පාට කොළ, ගම්, කතුර
- සුබ පැතුම් පතක් සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය
- කුඩා සීනුවක් (නාදයක් නිකුත් කළ හැකි දෙයක්)
- ගුරුතුමියගේ චිත්‍රය පාට කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1**



- කුඩා සීනුව එක් වරක් නාද කරන්න. සිසු අවධානය ගුරුතුමිය වෙත ලබා ගන්න.
- ගුරුතුමිය තමා පිළිබඳ කෙටි හැඳින්වීමක් සිසුන් ඉදිරියේ පවසන්න.
- පළමුව ගුරුතුමියගේ නම පවසන්න.
- පසුව තමා පන්තිභාර/ විෂයභාර ගුරුතුමිය ද බව අවබෝධ කර දෙන්න.
- ගුරුතුමිය අඩංගු මෙම චිත්‍රය සිසුන්ට ලබා දී එහි මල් අලවා සාරිය ලස්සන කරවීමට පසුබිම සකසන්න.

**පියවර 2**

- පන්තියේ සියලු සිසුන් නැගිටුවන්න. පෙර දැනුම් දීම අනුව සිසුන් රැගෙන එන ලද බුලත්/මල් ගුරුතුමියට දී වැඳ ආචාර කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව සිසුන්ට උගන්වන අනෙකුත් ගුරුවරුන් හඳුන්වා දෙන්න. ඔවුන්ට ද වැඳ ආචාර කිරීමට සිසුන් යොමු කරන්න.
- තම පන්තිය අසල ඇති අනෙකුත් සමාන්තර පන්තිවල/වෙනත් පන්තිවල සිටින ගුරුවරුන්ව ද හඳුන්වා දෙන්න. එම ගුරුවරුන්ට ද වැඳ ආචාර කිරීමට අවස්ථාව ලබා දී සිසුන් ඒ සඳහා යොමු කරන්න.

පියවර 3

- සිසුන් පන්ති කාමරය තුළ හෝ එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- සූදානම් කරගෙන ඇති "ඇය කොණ්ඩෙ දිගට දාලා" ගීතයට සවන්දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

"ඇය කොණ්ඩෙ දිගට දාලා - හැම උදෙන් ම එනවා........"

පද රචනය :- ක්ලැරන්ස් විජේවර්ධන
ගායනය :- ලීලන්ති කරුණානායක
සංගීතය :- ක්ලැරන්ස් විජේවර්ධන

- පසුව නැවත වරක් එම ගීතය සිසුන්ට ඉදිරිපත් කර රංගනයෙන් යුක්ත ව එම ගීතය ගායනා කිරීමට යොමු කරන්න.

පියවර 4

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 2 අනුව පන්තිය නැවත පිරිසිදු කරවන්න.
- පහන පත්තු කර පන්ති කාමරයේ උපකරණ හා තම වතුර බෝතල් හා බෑග් ස්ථානගත කරවන්න.
- සිසුන් සියලු දෙනා නැගිටු වන්න. දෑත් එක්කර වැඳ ගැනීමට කියන්න.
- ඇස් පියා ගෙන තම ගුරුතුමිය උදෙසා යාච්ඤා කිරීමට සූදානම් වන්න.
- තමන්ට උගන්වන ලද සියලු ම ගුරුවරුන් උදෙසා යාච්ඤා කිරීමේ ඇති වැදගත්කම පහදන්න.
- සැම විට ම ඔවුන් වෙනුවෙන් යාච්ඤාවෙන් කෘතගුණ දැක්විය හැකි බව අවබෝධ කර දෙන්න.
- අත් වැඳ පපුව මත තබා යච්ඤා කළ යුතු ආකාරය අවබෝධ කර දෙන්න.
- පහත යාච්ඤාව ගුරුතුමිය පැවසූ පසු සිසුන්ට ද කීමට උපදෙස් දෙන්න.
(මෙවැනි නිර්මාණාත්මක යාච්ඤාවක් සාදා ගන්න.)

**ආදර දෙවි පියාණනී, අපේ ආදර ගුරුතුමිය වෙනුවෙන් ඔබ වහන්සේට ස්තුති ප්‍රසංශා කරමු. අපට උගන්වන අපේ ගුරුතුමියව ආශිර්වාද කළ මැනව. එතුමියට අවශ්‍ය නිරෝගී සුවය ලබා දුන මැනව. ආමෙන්.**

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 3 සඳහා සිසුන් යොමු කරන්න.

පියවර 5

- පෙර දැනුම් දීමට අනුව කාඩ්පතක් නිර්මාණය කිරීමට සිසුන් රැගෙන එන ලද ද්‍රව්‍ය ගැනීමට පවසන්න. රැගෙන එන ලද දේවල් භාවිත කර අලංකාර සුබ පැතුම් පතක් නිර්මාණය කිරීමට සිසුන්ව යොමු කරන්න.
- සියලු ම සිසු නිර්මාණ අගය කරන්න.
- තම ආදරය ගුරුතුමියට දැක්වීම සඳහා නිර්මාණය කළ සුබ පැතුම් පත ගුරුතුමියට පිළිගැන්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- දෙවි සමිඳුන්ගේ ආදරය අපට කියා දෙන ගුරුතුමියව පාට කරන්න.
- චිත්‍ර නරඹමින් ගැළපෙන වගන්තිය ශබ්ද නගා කියවන්න.
- ගුරුතුමියට බුලත් දී වැඳීමට පසුතලය සකසන්න. ගුරුතුමියට දේව ආශීර්වාදය පතා විශ්වාසයෙන් හා භක්තියෙන් යාච්ඤා කරවන්න.

තක්සේරු කිරීම :

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය ගුණ ධර්ම හඳුනා ගනියි. | 7.1.1 | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සාරධර්ම හඳුනා ගනී. | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සාරධර්ම තරමක් දුරට හඳුනා ගනී. | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය සාරධර්ම ගුරු සහය ඇතිව හඳුනා ගනී. | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සාරධර්ම හඳුනා ගැනීමේ දුෂ්කරතා දක්වයි. |
| 7.2 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 | යහපත් දරුවෙකු ලෙස නිවැරදි ව හැසිරෙයි. | යහපත් දරුවෙකු ලෙස තරමක් දුරට නිවැරදි ව හැසිරෙයි. | යහපත් දරුවෙකු ලෙස ගුරු සහය ඇතිව නිවැරදි ව හැසිරෙයි. | යහපත් දරුවෙකු ලෙස නිවැරදි ව හැසිරීමට දුෂ්කරතා දක්වයි. |

# 6

## සංකල්පය - පාරිසරික සංවේදීත්වය

# සහයෝගයෙන් වැඩ කරමු

දේවස්ථානයේ, නිවසේ හා පාසල් ක්‍රීඩා පිටියේ අවට පරිසරය පිරිසිදු ව තබා ගැනීමට සහයෝගයෙන් වැඩ කළ යුතු බව අවබෝධ කරගෙන ජය පරාජය සතුටින් දරා ගනිමින් ඉවසීමෙන් යුතු ව කටයුතු කිරීම හා තම අවට පරිසරය අලංකාර ව තබා ගැනීම මෙහි අරමුණයි.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8. තමා අවට පරිසරය පිරිසිදුවට හා පිළිවෙළකට තබා ගැනීමට ක්‍රියා කරයි. | සහයෝගීතාවය | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.2 නිර්මාණශීලි බව |
| 9. ආගමික ශාස්තෘන් වහන්සේලා සොබා දහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳ ව දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | සොබා දහම | 9.1 කතාන්දර කවි ඇසුරෙන් සොබා දහමේ වටිනාකම හඳුනා ගනී. | 9.1.3 අදහස් ප්‍රකාශ කිරීම. |

**ඉගෙනුම් සම්පත් :**

- සිගිතිකා ගීතිකා - "ලස්සන සමනලයෙකු වාගේ" ගීතිකාව
- සම්පූර්ණ ගීතිකාව අඩංගු පෝස්ටරය
- කොඩිය නිර්මාණයට අවශ්‍ය දෑ සහ රඳවනයක්
- සහයෝගයෙන් වැඩ කරන චිත්‍ර අඩංගු පෝස්ටරය
- රංගනයට අවශ්‍ය ඇඳුම්
- ප්‍රතිමාව ඉදිරියේ තැබීමට මල්
- පොත් මුල්ල සඳහා අවශ්‍ය ආගමික පොත් පත්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1**

- ▪ පහත චරිත රඟ දක්වන සිසුන් ඉදිරියට පැමිණෙන ලෙස පවසන්න.
- ▪ නිවසක සිදුවන පහත අකාරයේ සිද්ධියක දෙබස් රංගනයෙන් ඉදිරිපත් කරවන්න.

තාත්තා :- අපි කොළ කැද හදමු
අම්මා :- හා හදමු. මට උදවු කරනවා ද?
අයියා :- ඔව් අම්මේ, මම පොල් ගාන්නම්
නංගී :- මම කොළ තෝරන්නම්
තාත්තා :- මම කොළ කොටලා දෙන්නම්
අම්මා :- මෙහෙම උදවු කරනවා නම් කොළ කැඳ හදන එක හරිම ලේසියි
තාත්තා :- ඔන්න මගේ වැඩ ඉවරයි. මම කෝප්ප හෝදලා ගේන්නම්
අක්කා :- තාත්තට මමත් උදවු කරන්නම්
මල්ලී :- අම්මේ ඔන්න මම දරත් ගෙනාවා
අම්මා :- අද කොළ කැඳ ගොඩක් රහ වෙයි, හැමෝම උදවු වුණ නිසා
තාත්තා :- ඔන්න මම හැමෝටම කැඳ කෝප්පවලට දැම්මා
නංගී :- තාත්තෙ අපේ ටීචර් කිව්වා කෑමට පෙර යාච්ඤා කරන්න කියලා. එන්න අපි යාච්ඤා කරමු

- මෙම සිද්ධිය අංග චලන සහිත ව ඉදිරිපත් කිරීමට සිසුන්ට සහාය වන්න.
- ඉදිරිපත් වූ සිසුන්ව අගය කරන්න.
- පවුලේ මෙලෙස සහයෝගයෙන් වැඩ කළ අවස්ථා විමසන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතේ අම්මා/තාත්තා/අයියා/අක්කා/නංගී/මල්ලී සහයෝගයෙන් වැඩ කිරීම චිත්‍රය නිරීක්ෂණය කර සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2
- සිසුන් පැමිණ ඇති ප්‍රමාණය අනුව කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට පහත ක්‍රියාකාරකම් පවරන්න.
- ජේසු ප්‍රතිමාව තබන ස්ථානය/පොත් මුල්ල පිළියෙළ කිරීම/නිර්මාණ පුවරුව සකස් කිරීම කණ්ඩායම් පිළියෙළ කිරීම වැනි විවිධ කාර්යයන් කිරීමට සිසුන්ට බෙදා දෙන්න.
- කණ්ඩායම් අනුව මෙම ක්‍රියාකාරකම් කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න.
- සිසු ක්‍රියාකාරකම් අගයන්න.
- සිසුන්ට මෙම ගීතිකාව සවන්දීමට අවස්ථාව ලබා දෙන්න.
- තමන්ට අදාළ චරිත රංගනය කරමින් ජේසු සමිඳුන්ගෙන් ගීතිකාවට අනුව ප්‍රශ්න කරයි.
- ගීතිකාවට අනුව ජේසු සමිඳුන් මෙන් පිළිතුරු දෙමින් රංගනයේ යෙදෙයි.

ලස්සන සමනලයෙක් වාගේ - ඇදිලා යන මල් පාරේ
තටු සලා පියඹලා ආවොත් ඔබ හමු වේදෝ
ජේසුනි ඔබ හමු වේදෝ
ලස්සන හොඳ ළමයෙකු වාගේ නොසැලී යහපත පාරේ
පය තබා වෙහෙසිලා ආවොත් මා හමු වේවී - ළමයෝ මා හමු වේවී
එක එක පාටින් සැරසීලා හැඩ වැඩ ඇඳුමක් ඇඳලා පියකරු
සිනහවෙන් ආවොත් ඔබ හමු වේදෝ ජේසු ඔබ හමු වේදෝ



- සවන් දෙන ලද ගීතිකාව අත්පොළසන් දෙමින් සතුටින් ගායනා කරවන්න.
- රංගනයක යෙදෙමින් සහෝදරත්වයෙන් යුතු ව ක්‍රියාකාරකමේ යොදවන්න.
- ගීතයේ අරුත සිසුන්ගෙන් විමසන්න. දෙන ලද පිළිතුරු අගයන්න.

පියවර 3
- මීසමේ කොඩි ගස එසවූ දින ගැන සිසුන් සමග සාකච්ඡා කරන්න. සිසු අදහස් අගය කරන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතේ මීසමේ කොඩිගස එසවූ අවස්ථාව දැක්වෙන චිත්‍රය නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහි සඳහන් වගන්ති ශබ්ද නගා කියවීමට සිසුන්ව යොමු කරන්න.
- මීසමේ කොඩි ගස එසවීමේ පරමාර්ථ සිසුන්ට පහදා දෙන්න.
- එමගින් දරුවන් තුළ තිබිය යුතු යහපත් ගුණාංග සිසුන්ට හඳුන්වා දෙන්න.

  උදා:- ප්‍රීතිය/ සාමය/ බෙදා ගැනීම/ කරුණාව/ එකමුතුකම ආදී මෙම ගුණාංග ගැන සිසුන් සමග කතා කරන්න.
- ඉන් පසුව සිසුන් ලවා කොඩියක් නිර්මාණය කරවන්න. ඒ තුළ යහපත් ගුණාංගයක් ලියවන්න.
- තම කොඩිය ඔසවා එම ගුණාංගය සැමට අන් අයට ඇසෙන සේ ප්‍රකාශ කරවන්න.
- සන්සුන්ව පැමිණ එම කොඩි බඳුනේ රඳවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**
- ගීතිකාව අරුත්බරව ගායනා කරවන්න.
- පවුලේ සැම සහයෝගයෙන් වැඩ කරන චිත්‍රය බලා සරල වගන්ති කියවීමට යොමු කරන්න.
- කොඩි ගස එසවීමේ චිත්‍රය දෙස බලා දී ඇති වගන්ති කියවීමට යොමු කරන්න.
- රූප පාට කරවන්න.

තක්සේරු කිරීම :

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 8.2 අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.2.2 | නිර්මාණශීලී ව අදහස් ප්‍රකාශ කරයි. | නිර්මාණශීලී අදහස් තරමක් දුරට ප්‍රකාශ කරයි. | නිර්මාණශීලී අදහස් සහය ඇතිව ප්‍රකාශ කරයි. | නිර්මාණශීලී අදහස් ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 9.1 කතන්දර/ කවි ඇසුරෙන් සොබා දහමේ වටිනාකම හඳුනා ගනියි. | 9.1.3 | සහයෝගයෙන් වැඩකිරීම පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | සහයෝගයෙන් වැඩකිරීම පිළිබඳ අදහස් තරමක් දුරට ප්‍රකාශ කරයි. | සහයෝග යෙන් වැඩකිරීම පිළිබඳ අදහස් සහය ඇතිව ප්‍රකාශ කරයි. | සහයෝගයෙන් වැඩකිරීම පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# අන්තර්ගතය
## තුන්වන වාරය


| | |
|---|---|
| 1 පාපය සේදූ ජලගැල්ම | 36 |
| 2 දෙවිඳුන්ට ආදරය කළ තාත්තා | 39 |
| 3 අපිත් දේව දරුවෝ | 42 |
| 4 විශ්වාසයේ අම්මා | 45 |
| 5 බෙත්ලෙහෙමයි කිතු උපතයි | 48 |
| 6 ශුද්ධ වූ නික්ලස් මුනිතුමා | 50 |
| 7 නත්තල් බැති ගී | 52 |
| 8 දහම් දෙසූ ජේසු කුමරු | 54 |

# 1

## සංකල්පය - චරිත සංවර්ධනය

# පාපය සේදූ ජලගැල්ම

නව මැවිල්ලක් වූ නෝවා ආදර්ශවත් කර ගනිමින් දෙවියන් වහන්සේට කීකරුව ආදරය කිරීමත්, නිතර ම උන්වහන්සේට ස්තුති ප්‍රසංශා කිරීමත්, අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෘවරයා/ නිර්මාතෘවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනී. | ආගමික කතන්දර | 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 ආගමික කතන්දරවලට සවන්දීම |
| | දෙවි පියාණන් වහන්සේගේ ගුණාංග | 2.3 ආගමික කතන්දර ඇසුරින් ලබා ගතහැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 ආදර්ශයක් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- අන්තර්ජාලයෙන් බාගත කර ගත් නෝවාගේ කතාව
- කතාව ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යය
- ඇසුරුම් පෙට්ටි/කාඩ්බෝඩ්, කතුරු, ගම්
- ගීතිකා පොත (කිතුනු ගී 259) "තුති පුදම් ඔබට සමිඳේ" ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය
- සතුන් නිර්මාණයට අවශ්‍ය විවිධ ශාක පත්‍ර, ගම්
- ශු. බයිබලය උත්පත්ති (7 : 1-24)
- විශාල නැවක් අඩංගු පෝස්ටරය
- නැව මතුපිට ඇලවීම සඳහා ලී කුඩු හා පාට
- ගීතිකාව අඩංගු පෝස්ටරය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- අන්තර්ජාලයේ (You Tube) සිංහල භාෂාවෙන් "බයිබල් කතා" ලෙස පිරික්සන්න. "නෝවා සහ මහා ජල ගැල්ම" තෝරා ගන්න.
- එම කතාව සිසුන්ට ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් තෝරා ගන්න.
- කතාව ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යවලින් ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගන්න.
- සියලු සිසුන් නිශ්ශබ්ද ව වාඩි කරවන්න.
- සූදානම් කරගෙන ඇති "නෝවා සහ ජල ගැල්ම" කතාව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සියලු ම සිසුන්ට හොඳින් ඇසෙනවා සහ පෙනෙනවා ද යන්න පරීක්ෂා කර බලන්න.
- මෙම කතාව සියලු ම සිසුන්ට නැරඹිය හැකි ලෙස අසුන් ගන්වන්න.
- සිසුන් නැරඹූ කතාව අවබෝධ කරගත් ආකාරය විමසීම සඳහා ප්‍රශ්න කරන්න.
- එම කරුණු පිළිබඳ සාකච්ඡා කරමින් කතාව තව දුරටත් සිසුන්ට අවබෝධ කර දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ පාඩම කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දී සහය වන්න.

පියවර 2

- කතාව නැරඹීමෙන් පසු සිසුන් නැවත පන්ති කාමරයට රැගෙන එන්න.
- සූදානම් කරගෙන ඇති පහත ප්‍රශ්න සිසුන්ට ඉදිරිපත් කරන්න.
    1. කතාවේ නම කුමක්ද?
    2. විශාල නැව සෑදුවේ කවුද?
    3. නෝවාට නැව සෑදීමට පැවසුවේ කවුද?
    4. දෙවියන් වහන්සේ මහා ජල ගැලමෙන් නෝවාව බේරා ගත්තේ ඇයි?
    5. නෝවාට දෙවියන් වහන්සේ නැව තුළට ගැනීමට කීවේ කවුරුන්වද?
    6. නෝවා සමග ජල ගැල්මෙන් බේරුනේ කවුද?

- මෙලෙස ප්‍රශ්න තුළින් ලබාගත් දැනුම තහවුරු කරන්න. ඒ තුළින් දේව ආදරය හිමි වූ අන්දම ඔබගේ වචනයෙන් පහදන්න.
- දේව ආදරයේ සුවිශාලත්වය තහවුරු කරන්න.

පියවර 3
- පෙර දැනුම් දුන් පරිදි සිසුන් රැගෙන ආ ද්‍රව්‍ය යෝග්‍ය පරිදි අසුරන්න.
- ඇසුරුම් පෙට්ටි, කාඩ්බෝඩ් වැනි දේවල්වලින් සුදුසු ද්‍රව්‍ය තෝරා ගෙන නෝවාගේ නැව නිර්මාණය කරවන්න.
- සිසුන් රැගෙන ආ ශාක පත්‍ර හා වර්ණ භාවිත කරමින් සතුන් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න. නව නිර්මාණ ලෙස සිසු දක්ෂතා මතු කරගන්න.
- ක්‍රියාකාරකම් පොතේ දී ඇති චිත්‍ර ඇසුරින් සිසු නිර්මාණ ක්‍රියාකාරකම් පොතේ අලවන්න.
- සියලු ම සිසු නිර්මාණ අගයන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 2 "නෝවා සහ ජල ගැල්ම" ඇඳ පාට කිරීමට සිසුන්ට පවසන්න.
- විශාල නැව අඩංගු චිත්‍රය ලී කුඩු යොදා සම්පූර්ණ කර පාට කරවන්න.
- හැකි නම් කණ්ඩායම් අනුව නෝවාගේ නැව හා සතුන් නිර්මාණය කරවන්න.

පියවර 4
- නෝවා මෙන් සිසුන්ට කළ හැකි හොඳ වැඩ පිළිබඳ විමසන්න.
- සිසු පිළිතුරු හුණු පුවරුවේ ලියවන්න.
- නෝවා දෙවියන් වහන්සේට තුති පිදුවා වගේ "අපිත් දෙවියන් වහන්සේට තුති පුදමු" යැයි සිසුන්ට පවසන්න.
- පහත ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න.
  තුති පුදම් ඔබට සමිඳේ - මුළු හදවතින් මගේ

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**
- ක්‍රියාකාරකම 01
    - නෝවාගේ නැව ක්‍රමවත්ව වර්ණ ගන්වන්න.
- ක්‍රියාකාරකම 02
    - ශාකපත්‍ර යොදා ගෙන මෙවැනි සතුන් නිර්මාණය කරවන්න.
- ක්‍රියාකාරකම 03
    - සිසුන්ට කළ හැකි හොඳ වැඩ විමසා බලා ලියවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.1 ආගමික කතන්දරවලට කැමැත්තෙන් සවන් දෙයි. | 2.1.1 | නෝවාගේ චරිතයට සවන් දී හොඳින් පිළිතුරු දෙයි. | නෝවාගේ චරිතයට තරමක් දුරට සවන් දී පිළිතුරු දෙයි | නෝවාගේ චරිතයට සවන් දී සහාය ඇතිව පිළිතුරු දෙයි. | නෝවාගේ චරිතයට සවන් දීමේ හා පිළිතුරු දීමේ දුෂ්කරතා දක්වයි. |
| 2.3 ආගමික කතා ඇසුරින් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.3.1 | නෝවාගේ කතාව ඇසුරින් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | නෝවාගේ කතාව ඇසුරින් ලබාගත හැකි ආදර්ශ තරමක් දුරට ප්‍රකාශ කරයි. | නෝවාගේ කතාව ඇසුරින් ලබාගත හැකි ආදර්ශ සහය ඇතිව ප්‍රකාශ කරයි. | නෝවාගේ කතාව ඇසුරින් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |

# 2 සංකල්පය - චරිත සංවර්ධනය
# දෙවිඳුන්ට ආදරය කළ තාත්තා

ආබ්‍රහම් තුමාගේ ජීවිතයෙන් ඉස්මතු වන දෙවියන් වහන්සේ කෙරෙහි ඇති අචල විශ්වාසයත්, කීකරුකමත් පෙරදැරි කරගෙන තම චරිත සංවර්ධනය කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ආගමික ශාස්තෲවරයා/ නිර්මාතෲවරයා පිළිබඳ කතාන්දර හා උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග හඳුනා ගනී. | ආගමික කතන්දර | 2.2 ආගමික කතන්දර ඇසුරින් ආගමික ශාස්තෲවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කිරීම |
| | සුවිශේෂ ගුණාංග | 2.4 උපදේශ කාව්‍යයකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.2 තාලයට ගායනා කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය (උත්පත්ති 12)
- කිතුනු ගී 207 - "ඉඩ දෙන්නෙපා විශ්වාසයේ" ගීතිකාව
- ඉඩ දෙන්නෙපා විශ්වාසයේ සම්පූර්ණ ගීතිකාව අඩංගු පෝස්ටරය
- පාට පැන්සල්
- යාච්ඤා කිරීම සලකුණු කරන සියලු ම සිසුන්ගේ නම් ඇතුළත් වගුව
- සිසුන් සංඛ්‍යාව අනුව තරු
- ආබ්‍රහම් තුමා ගැන දැක්වෙන වීඩියෝ දර්ශන හෝ youtube
- යාච්ඤාව අඩංගු පුවරුව
- ආබ්‍රහම් තුමා හා ඊසාක් අඩංගු පෝස්ටරය (එහි "ඊසාක් මෙන් කීකරු වෙමු" යන පාඨය අඩංගු විය යුතුයි)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 01

- ඉඩ දෙන්නෙපා විශ්වාසයේ සම්පූර්ණ ගීතිකාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න. පෝස්ටරයේ අඩංගු වචන අවබෝධයෙන් යුතු ව කියවන්න. එහි අර්ථය සිසුන්හට පහදන්න.

> ඉඩ දෙන්නෙපා විශ්වාසයේ පහන නිවී යන්න
>
> අඳුරේ ගැලී යයි ජීවිතේ අවදි වෙලා ඉන්න

- ගීතිකාව ශ්‍රවණය කරවන්න.
- ඉන්පසු ගායනා කරවන්න.
- රග දක්වමින් අර්ථය නිරූපණය කරන්න. ඉන්පසු සිසුන් ලවා රග දක්වන්න.

පියවර 02

- අන්තර්ජාලයේ (You Tube) සිංහල භාෂාවෙන් "බයිබල් කතා" ලෙස පිරික්සන්න. "ආබ්‍රහම්" තෝරා ගන්න. (ආබ්‍රහම් තුමාගේ චරිතය වීඩියෝ දර්ශන හෝ පින්තූර නැරඹීමට සලස්වන්න)
- ශුද්ධ බයිබලයේ (උත්පත්ති 12:1-5) සිට අඩංගු කතා පුවත සාරාංශ කර රසවත්ව ඉදිරිපත් කරවන්න.
- කතන්දර ස්වරූපයෙන් මෙම කොටස පහදන්න.
- ආබ්‍රහම් තුළ තිබූ විශ්වාසයේ ගුණාංග විස්තර කර දෙන්න.
- ආබ්‍රහම් තුමා පිළිබඳ පහත සඳහන් කරුණු නැවත මතක් කර දෙන්න.

දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාව විශේෂයෙන් තෝරා ගත් බව
විශ්වාසයේ පියා වන බව
කීකරු වී ගමන් කළ බව
ආබ්‍රහම් තුමාගේ බිරිඳ සාරා වන බව
අබ්‍රහම් තුමාගේ දරුවා ඊසාක් බව
ඊසාක් තුළ තිබූ කීකරුකම

පියවර 03

- අප තුළ විශ්වාසය වැඩි කර ගැනීමට කුමක් කළ යුතු දැයි සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න.
- යාච්ඤා කළ යුතු බව සිසු අදහස් තුළින් ලබා ගන්න. ආබ්‍රහම් තුළ පැවති විශ්වාසය නැවත අවබෝධ කරවන්න.
- යාච්ඤාව අඩංගු මෙම පෝස්ටරය ප්‍රදර්ශනය කරවන්න.
- **"ආදර දෙව්පියාණනි අපට විශ්වාසය නමැති දීමනාව දුන මැනව."** මෙම පුවරුවේ අඩංගු වචන අවබෝධ කර දෙන්න.
- සියලු ම සිසුන් සමග විශ්වාසයෙන් හා බැතියෙන් යුක්ත ව මෙම යාච්ඤාව බැතියෙන් කියවන්න.
- මෙම යාච්ඤාව මතකයෙන් කිව හැකි සිසුන් පිළිබඳ අවධාරණය කරන්න එම සිසුන් ඉදිරියට ගෙනැවිත් උච්චාරණය කරවන්න.
- ඉන්පසු මුළු පන්තිය ම මෙම යාච්ඤාව නිවැරදි ඉරියව්වෙන් උච්චාරණය කරවන්න සිසුන් අගයන්න.

පියවර 04

- කීකරුකම කිතුනු ගුණාංගයක් බව සිසුන්ට පහදා දෙන්න.
- ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේට කීකරු වූ ලෙස ම ඊසාක් තම පියාට කීකරු වූ අවස්ථාව අවස්ථා නැවත සිසුන්ට මතක් කර දෙන්න.
- දෙමාපියන්ට හා ගුරුවරුන්ට කීකරු වූ අවස්ථා පිළිබඳ සංවාදයක යෙදෙන්න.
- දෙමාපියන්ට හා ගුරුවරුන්ට කීකරු වීමෙන් ජීවිත ජයග්‍රහන ලබා ගත හැකි බව සිසුන්ට මනාව පසක් කර දෙන්න.
- ගීතිකාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරවන්න.
- සිසුන් හා එක්ව බැතියෙන් සතුටින් හා අත්පොළසන් දෙමින් ගීතිකාව ගායනා කරවන්න.
- දෙමාපියන්ට කීකරු වී නිවසේදී කටයුතු කරන ආකාරය අඩංගු මෙම ක්‍රියාකාරකමේ යොදවන්න.
- "ඊසාක් මෙන් කීකරු වෙමු" යන පාඨය අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න ඉන්පසු සිසුන් ලවා මෙම පෝස්ටරය සම්පූර්ණ කරවන්න.

ඊසාක් මෙන් කීකරු වෙමු.

| සිසුන්ගේ නම | නිවසේදී | පාසලේදී | පල්ලියේදී |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

- නිවසේ පාසලේ හා පල්ලියේදී කීකරු වූ අවස්ථා යොදා ගනිමින් මෙම පුවරුවේ හරි ලකුණ යොදවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ක්‍රියාකාරකම 01
  - ආබ්‍රහම් කතාව ඇසුරෙන් හරි වැරදි ලකුණු කරවන්න.
- ක්‍රියාකාරකම 02
  - ආබ්‍රහම් තුමා තුළ පැවති යහපත් ගුණාංග පුරුදු කළ අවස්ථා අවබෝධයෙන් කියවීමට හා පාට කිරීමට සහාය වන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 2.2 ආගමික කතන්දර ඇසුරින් ආගමික ශාස්තෘවරයාගේ සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | 2.2.1 | ආබ්‍රහම් කතා පුවතේ අඩංගු සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කරයි. | ආබ්‍රහම් කතා පුවතේ අඩංගු සුවිශේෂ ගුණාංග තරමක් දුරට ප්‍රකාශ කරයි. | ආබ්‍රහම් කතා පුවතේ අඩංගු සුවිශේෂ ගුණාංග සහාය ඇතිව ප්‍රකාශ කරයි. | ආබ්‍රහම් කතා පුවතේ අඩංගු සුවිශේෂ ගුණාංග ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 2.4 උපදේශ කාව්‍යයකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.4.2 | ගීතිකාව තාලයට ගායනා කරයි. | ගීතිකාව තරමක් දුරට තාලයට ගායනා කරයි. | ගීතිකාව සහාය ඇතිව තාලයට ගායනා කරයි. | ගීතිකාව තාලයට ගායනා කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 3

## සංකල්පය - ආචාර ධර්ම සාරධර්ම හා සම්මතයන්

# අපිත් දේව දරුවෝ

ප්‍රසාද ස්නාපනය නැමති දේව ප්‍රසාද නිධානය තුළින් දේව දරුවෙකු වූ බවත් "අබ්බා පියාණෙනී" ලෙස ආමන්ත්‍රණය කළ හැකි බවත් අවබෝධ කරගෙන යහපත් දැහැමි කිතුනු දරුවෙකු ලෙස ආගමික වතාවත්වල නිරත වෙමින් නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කිරීම මෙහි අරමුණ වේ

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6. ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි වත්පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | ආගමික වත් පිළිවෙත් | 6.2 ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කරයි. | 6.2.1 නිවැරදි සිරිත් විරිත් අනුගමනය කිරීම |
| | සිරිත් විරිත් හා ඉරියවු | 6.4 ආගමික කටයුතුවලදී අදාළ වචන භාවිත කරයි. | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- ශු.බයිබලය
- කිතුනු ගී 267 - "දෙවිඳුන් හඳුනන්නේ" ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය, හා පෝස්ටරය
- ඉටිපන්දම්, ජලය හා බේසමක්, තෙල් කුප්පිය, චරිත සඳහා අවශ්‍ය ඇඳුම්
- ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය අඩංගු බාගත වීඩියෝව/ චිත්‍රය/ පෝස්ටරය
- නිර්මාණ පුවරුව
- අප යාච්ඤා කළ යුතු අවස්ථා අඩංගු පෝස්ටරය
- "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය...." යන පාඨය අඩංගු පෝස්ටරය
- චිත්‍ර නිර්මාණයට අවශ්‍ය කොළ හා පාට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 01

- ගුරුභවතා හෝ දක්ෂ සිසුවෙක් හෝ සිසුවියක් පියතුමා මෙන් සැරසී පන්තියට පැමිණෙන්න. බෝනික්කෙක් ගෙන අද දින මේ කුඩා දරුවාව දේව දරුවෙක් කරන බව පවසන්න. පෙර දැනුම් දුන් පරිදි දරුවාගේ ආත්මික මව්පියන් සහ දරුවන්ගේ මව්පියන් ලෙස සැරසුණු දරුවන්ව ඉදිරියට කැඳවන්න. බෝනික්කා ඔවුන් දෙදෙනා අතට දෙන්න. ඉන් පසු ඉටි පහන් දල්වන්න.
- ඉටි පහන් දල්වා ජලය වත්කොට අදාළ වචන පවසමින් බෝනික්කාට ප්‍රසාද ස්නාපනය දෙන්න.
- දරුවාව තෙලින් ආලේප කර ආසිරි පැන්වලින් ආශීර්වාද කරන්න.
- මෙලෙස කුඩා කාලයේ සැම දරුවෙක්ව ම ප්‍රසාද ස්නාපනය කළ බව පැහැදිලි කර දෙන්න.
- මෙලෙස සියලු දෙනා දේව දරුවන් වූ බවත් එහි ඇති වැදගත්කමත් පැහැදිලි කරවන්න.
- "අබ්බා පියාණෙනි" ලෙස දෙව්පියා ඇමතිය හැකි බවත් සිසුන්ට පැහැදිලි කරන්න.
- ඔබව දේව දරුවෙකු බවට පත් කළ දෙව් පියාට තුති දෙමින් සුළු යාච්ඤාවක් කියන්න.
- දැන් ඔබ දේව දරුවෙකු බවත් අබ්බා පියාණනි ලෙස දෙව් පියාණන් ඇමතිය හැකි බවත් අවබෝධ කර දී යාච්ඤා කරවන්න.

පියවර 02

- ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය අඩංගු වීඩියෝව/චිත්‍රය/පෝස්ටරය ප්‍රදර්ශනය කරවන්න.
- ශු. බයිබලයේ ලූක් ශුභාරංචියේ 3:21 අඩංගු කරුණු සිසුන්ට පහදන්න. මෙහිදී ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය අඩංගු වූ ශ්‍රී වචන පිළිබඳ අවබෝධ කරවන්න.
- දෙවි පියා තම පුත්‍රයා පිළිබඳ ව ලොවට ප්‍රකාශ කළ අවස්ථාව හොඳින් නැවතත් පහදන්න.
- ජේසු සමිඳුන් බෞතීස්ම ස්නාපනය ලද බව තහවුරු කරන්න.
- එම අවස්ථාවේ දෙව්පියා ජේසු සමිඳුන් පිළිබඳ කළ ප්‍රකාශය ගාම්භීරව ප්‍රකාශ කරන්න.
- "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය." පාඨය අඩංගු ලස්සන වැකිය ප්‍රදර්ශනය කරන්න.
- අද දෙවි පියා ඔබේ නම කියා අමතන බවත් දෙවි පියාට ආදරය කළ යුතු බවත් පවසන්න.

පියවර 03

- සියලු ම සිසුන් චක්‍රාකාර ව සිටුවන්න. ගීතිකාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරවන්න.
- ගීතිකාවට සවන් දෙමින් එහි අඩංගු වචන වෙත අවධානය යොමු කරවන්න.
- සියලු දෙනා සතුටින් රඟමින් ගීතිකාව ගායනා කරන්න.
- ආගමික වතාවත් වලදී නිවැරදි ඉරියව් භාවිතය, වචන භාවිතය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

පියවර 4

- ක්‍රියාකාරකම් පොතේ අඩංගු 1, 2, 3 ක්‍රියාකාරකම් කිරීම සඳහා සිසුන්ට උපදෙස් දෙන්න.
- තම ආත්මික මව්පියන් පිළිබඳ තොරතුරු සොයා එහි සටහන් කරවන්න.
- "අබ්බා පියාණෙනී" කියා දෙවිදුන් ඇමතීමට පුහුණු කරවන්න.
- දේව දරුවෙකු ලෙස ක්‍රියා කළ යුතු ආකාරය අඩංගු චිත්‍රයක් සිසුන් මගින් නිර්මාණය කරවන්න.
- එම නිර්මාණ නිර්මාණ පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- අප යාච්ඤා කළ යුත්තේ කුමන අවස්ථාවලද යන්න සිසු අදහස් පෙළ ගස්වා ලියන්න.
  උදා :
  - උදෑසන අවදි වූ විට
  - අසනීප වූ විට
  - පාසල් යාමට පෙර
- යාච්ඤා කිරීම සලකුණු කිරීමේ චාට් එක ප්‍රදර්ශනය කරන්න.
- පන්තියේ යාච්ඤා කළ යුතු අවස්ථාවේ එම වගුවේ එක් එක් සිසුවා ලවා තරුව බැගින් ඇලවීමට උපදෙස් දෙන්න.
- සැම විටම දෙවි පියාට තුති පුද කළ යුතු බව හොඳින් අවබෝධ කර දෙන්න.

| පුංචි ඔබ යාච්ඤා කළ යුතු අවස්ථාව | 1 දිනය | 2 දිනය | 3 දිනය | 4 දිනය | 5 දිනය | 6 දිනය | 7 දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1. උදේ අවදි වූ විට | | | | | | | |
| 2. රාත්‍රී නින්දට යාමට පෙර | | | | | | | |
| 3. පාසල් යාමට පෙර | | | | | | | |
| 4. පාඩම් වැඩ කිරීමට පෙර | | | | | | | |
| 5. ආහාර ගැනීමට පෙර හා පසු | | | | | | | |

- දේව දරුවෙක් ලෙස වැඩිහිටි අයට උපකාර කරන අන්දම භාග කඩදාසියක චිත්‍රයට නඟන්න උපදෙස් දෙන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ක්‍රියාකාරකම 1 හි ඇති චිත්‍රය යෝග්‍ය වර්ණ යොදා ගනිමින් නිම කරවන්න.
- ක්‍රියාකාරකම 2 සඳහා උපදෙස් දෙමින් සහාය වන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 6.2 ආගමික කටයුතුවල නිරත වීමේදී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කරයි. | 6.2.1 | ආගමික කටයුතුවල නිරත වීමේදී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කරයි. | ආගමික කටයුතුවල නිරත වීමේදී නිවැරදි සිරිත් විරිත් තරමක් දුරට අනුගමනය කරයි. | ආගමික කටයුතුවල නිරත වීමේදී නිවැරදි සිරිත් විරිත් සහය ඇති ව අනුගමනය කරයි. | ආගමික කටයුතුවල නිරත වීමේදී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.4 ආගමික කටයුතුවලදී අදාළ වචන භාවිත කරයි. | 6.4.1 | යාච්ඤාවේදී නිවැරදි වචන භාවිත කරයි. | යාච්ඤාවේදී නිවැරදි වචන තරමක් දුරට භාවිත කරයි. | යාච්ඤාවේදී නිවැරදි වචන සහාය ඇතිව භාවිත කරයි. | යාච්ඤාවේදී නිවැරදි වචන භාවිත කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 4

## සංකල්පය - ආචාර ධර්ම සාරධර්ම හා සම්මතයන්

# විශ්වාසයේ අම්මා

**"නමෝමරිය" යාච්ඤාවේ පසුබිම හොඳින් අවබෝධ කරගෙන මරිය තුමියගේ මැදිහත් පිහිට පතමින් නිවැරදිව හා අර්ථවත්ව යාච්ඤා කිරීම, ආගමික පාඨ හඳුනා ගැනීම, හොඳින් උච්චාරණය කිරීම මින් අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම් වාග්මාලාව, සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ සංකල්පය හඳුනා ගනී. | වන්දනා හා වත් පිළිවෙත්<br>සාරධර්ම හා සම්මතයන් | 1.4 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.4.1 ආගමික පාඨ හඳුනා ගැනීම<br>1.4.2 ආගමික පාඨ භාවිත කිරීම |

**ඉගෙනුම් සම්පත්:**

- ශුද්ධ වූ බයිබලය (ලූක් 1:28, 2: 42)
- "නමෝමරිය" යාච්ඤාව නිවැරදිව ලියූ පෝස්ටරය
- දේව මාතා ප්‍රතිමාව/පහන්/මල් මාලය
- මංගලම් කීම නිරූපණය කිරීමට අවශ්‍ය ඇඳුම්
- දේව මාතාවන්ට මංගලම් කීමේ අවස්ථාව අඩංගු බාගත කරන ලද චිත්‍රපටය
- නමෝ මරිය ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය/youtube
- "අම්මා පුදන්නයි" ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය (කිතුණු ගී 393)
- "ජේසු අම්මේ මේ අහන්න" ගීතිකාව අඩංගු සංයුක්ත තැටිය (කිතුනු ගී 396)
- ජපමාලය
- දේව දූතයාව නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
- කඩ ඉරි මත දේව මාතා රූපය පාට කිරීමට අවශ්‍ය පාට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- "ජේසු අම්මෙ මේ අහන්න" ගීතිකාව අඩංගු සීඩී තැටියට සවන් දීම සඳහා යෝග්‍ය පරිසරයකට සිසුන් රැගෙන යන්න.
- සවන් දුන් ගීතිකාවේ අඩංගු දෙව් මව් ගුණාංග පහදන්න.
- වාදනය කරන ලද ගීතිකාවට සවන් දෙමින් සිසුන් සමග ගීතිකාව ගායනා කරවන්න.
- බැතියෙන් රඟමින් ගීතිකාව නැවත ගායනා කරවන්න.
- ලූක් 1:28 සිසුන්ට පැහැදිලි වන සේ අර්ථවත් ව කියවන්න.

> " විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ
> සමිඳාණන් වහන්සේ ඔබ සමග ය. (ලූක් 1:28)

- ඉන් පිළිඹිබු වන පණිවිඩය කතන්දර ස්වරූපී ව සිසුන්ට වටහා දෙන්න.
- පෙර දැනුම් දුන් පරිදි සූදානම් වූ සිසුන් යොදා මරිය තුමියට මංගලම් කීමේ සිද්ධිය රඟ දක්වන්න.
- සුහද සංවාදයක යෙදෙමින් මරිය තුමියට ගාබ්‍රියෙල් දේව දූතයා කළ ප්‍රකාශය සියලුම සිසුන් සමග කියවන්න.
- ඉන්පසු මරිය තුමිය එළිසබෙත් තුමියට කළ ප්‍රකාශය පිළිබඳ අවබෝධ කර දෙන්න.

- මංගලම් කීමේ උතුම් අවස්ථාව ගැඹුරින් සිසුන්ට වටහා දෙන්න.
- ලූක් 1:42 සිසුන් ඉදිරියේ පැහැදිලි ව කියවන්න.

| ඔබ වනිතාවන් අතර අතිශයින් ආශීර්වාද ලද්දීය. ඔබ කුස ඔත් දරුඵලය ද ආශීර්වාද ලද්දේය. (ශු. ලූක් 1:42) | සාන්ත මරියනි දේව මෑණියනි පාපි වූ අප උදෙසා දැනුත් අපේ මරණ වෙලේදීත් යාච්ඤා කළ මැනව |
|---|---|

- විස්තර කරන පණිවිඩය කතන්දර ස්වරූපී ව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- රැගෙන ආ ඇඳුම් පැළඳුම් සහිතව මංගලම් කීමේ පුවත රඟ දැක්වීමේ පසුතලය සකසන්න.

පියවර 02
- දෙව්මවුන්ට මංගලම් කීමේ චිත්‍රපටය ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ගේ රඟ දැක්වීම හා දේව වචනය රඟ දැක්වීම සමග සසඳන්න.
- රැගෙන ආ දෙව්මව් ප්‍රතිමාව සුදුසු ස්ථානයක ගෞරවාන්විතව තබන්න.
- සිසුන් රැගෙන ආ මල් මාල/ මල් ප්‍රතිමාව ඉදිරියේ තබා ගෞරව කරවන්න.
- පෙර සිදු කළ මංගලම් කීමේ පුවත නැවත මතක් කරන්න.
- නමෝ මරියේ අවසන් කොටස පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- මරිය තුමිය අප වෙනුවෙන් මැදිහත් වන ආකාරය මෙම යාච්ඤාව තුළින් සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- **දෙව්මවුන්ට ගරු කරමු. වන්දනා නොකරමු.** යන්න සිසුන්ට ප්‍රත්‍යක්ෂ කරවන්න.
- සියලු ම සිසුන් ප්‍රතිමාව ඉදිරියේ නිවැරදි ඉරියව් භාවිත කරමින් නමෝමරිය යාච්ඤාව උච්චාරණය කරවන්න.
- කියවීම අපහසු සිසුන්ව දිරිමත් කරමින් තනි තනිව නිවැරදිව මෙම යාච්ඤාව කීමට සිසුන්ව පොලඹවන්න.
- සිසුන් හා එක්ව ජපමාල පන්තියක් උච්චාරණය කරන්න.
- "අම්ම පුදන්නයි ගීතිකාව" ගායනා කර මෙම භක්ති අභ්‍යාසය අවසන් කරන්න.

පියවර 03
- ජේසු සමිඳුන්ගේ මව මරිය තුමිය බවත් එතුමියට අපි විශේෂයෙන් ගෞරවය දක්වන බවත් පැහැදිලි කර දෙන්න.
- ජේසු අම්මා සතු සුවිශේෂ ගුණාංග පැහැදිලි කරන්න.
- මැයි මාසය හෙවත් මල් මාසය එතුමිය සඳහා විශේෂයෙන් කැප කර ඇති බවත් ඔක්තෝම්බර් මාසයත් විශේෂයෙන් එතුමියට ගෞරවය දක්වන බවත් පවසන්න.
- දේව අම්මා ආදර්ශ කර ගැනීමටත් දේව අම්මා වෙතට ගමන් කිරීමටත් සිසුන් යොමු කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**
- ක්‍රියාකාරකම 1 හි ඇති මරිය තුමියගේ චිත්‍රය නිවැරදි ව පාට කර නිම කරවන්න.
- ක්‍රියාකාරකම 2 හි සඳහන් පරිදි නිවැරදි ව යාච්ඤා කිරීමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම 3 හි අඩංගු පිළිතුර තෝරා ගැනීමට සහාය වන්න.
- ක්‍රියාකාරකම 4 නිවැරදි මග තෝරා ගෙන ගමන් කිරීම සඳහා සිසුන්ට උපදෙස් දෙන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 1.4 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.4.1 | මරියතුමියට මංගලම් කී පාඨ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මරියතුමියට මංගලම් කී පාඨ තරමක් දුරට හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මරියතුමියට මංගලම් කී පාඨ සහය ඇතිව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | මරියතුමියට මංගලම් කී හා හඳුනා ගැනීමේ දුෂ්කරතා දක්වයි. |
| 1.4 ආගමික පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.4.2 | නමෝමරිය යාච්ඤාව උචිත ලෙස භාවිත කරයි. | නමෝමරිය යාච්ඤාව උචිත ලෙස තරමක් දුරට භාවිත කරයි. | නමෝමරිය යාච්ඤාව සහය ඇතිව උචිත ලෙස භාවිත කරයි. | නමෝමරිය යාච්ඤාව උචිත ලෙස භාවිත කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 5 සංකල්පය - සමාජීය හා සංස්කෘතික සංවේදීතාව
# බෙත්ලෙහෙමයි කිතු උපතයි

**සාමයේ කුමරුන්ගේ උපත පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරමින් සැබෑ නත්තලක් සැමරීමට සූදානම් වීම හා දුගීන් සමඟ බෙදා හදාගෙන ක්‍රියාකාරීව නත්තල් උත්සවය සැමරීම මෙහි අරමුණ වෙයි.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | උත්සව හා සැමරුම් | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගි වීම<br>4.2.1 ක්‍රියාකාරී ව සහභාගි වීම |

**ඉගෙනුම් සම්පත් :**
- ශුද්ධ බයිබලය (ශු.ලූක් 1:26-38)
- කැරොල් ගීතිකා අඩංගු සංයුක්ත තැටි
- කිතුනු ගී 431
- වර්ණ, පාට කොළ
- නත්තල් ගසේ චිත්‍රයේ ඇලවීමට අවශ්‍ය දේවල්
- රංගනය සඳහා ඇඳුම් පැලඳුම්
- අන් අය හා බෙදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය
- ගව මඩුවක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1
- "කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ" ගීතිකාව ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙර දැනුම් දුන් පරිදි ගැළපෙන ඇඳුම් පැලඳුම්වලින් සැරසී කිතු උපත රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.
- තම චරිතයට අදාළ භූමිකාව තුළ චරිත නිරූපණයට අවකාශ සලසන්න.
- පහත සඳහන් චරිත රංගනය තුළින් ඉස්මතු කර ගන්න.
  - මරිය තුමිය / ජුසේ තුමා / එඬේරු / දේව දූතයෝ / පඬිවරුන් / සතුන්
- රංගනය දෙස බලා සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු අදහස් අගය කරන්න.
- ගව මඩුවක් සකස් කරගන්න.

පියවර 02
- ශු.ලූක් 1:26-38 දක්වා සිසුන්ට ඇසෙන සේ ශබ්ද නඟා කියවන්න.
- ජේසු කුමරු බෙත්ලෙහෙමේ ගව මඩුවේ උපන් බවත් මරිය තුමිය හා ජුසේ තුමා පිළිබඳවත් අවශ්‍ය කරුණු සැකෙවින් සිසුන්ට වටහා දෙන්න.
- ජේසු කුමරුන්ගේ උපත දෙසැම්බර් 25 දින සමරන බව සිසුන්ට අවබෝධ කර දෙන්න.
- ජේසු කුමරුන්ගේ උපත පිළිබඳ ව දැනුම් දුන් සුවිශේෂ පුද්ගලයන් පිළිබඳ සිසුන්ව දැනුවත් කරන්න. (එඬේරු / පඬිවරු)
- සිසු අදහස්වලින් පහත කරුණු ඉස්මතු කර දක්වන්න.
  - කිතු උපත සිදු වුණේ බෙත්ලෙහෙම් නුවර
  - ජේසු කුමරු ඉපදුණේ ගවමඩුවක වැනි කරුණු
- නත්තල් ගස / ගවලෙන / වල්ගා තරුව පිළිබඳ අවබෝධ කර දෙන්න.
- ගව ඔරුවක සැතපී සිටි ජේසු කුමරුන් දේව පුත්‍රයා බව සිසුන්ට මනාව අවබෝධ කර දෙන්න.

පියවර 03

- නත්තල් දින දිව්‍යපූජාවට සහභාගී වන අන්දම රඟදක්වන්න.
- අපි දැන් **දිව්‍යපූජාවට** යමු, සන්සුන්ව ගමන් කරමු, පඩුරු රැගෙන යමු, නියමිත වේලාවටම යමු, සාමය පතමු, ගීතිකා ගයමු, දෙවිඳුන් යදිමු.
- නත්තල් දා දිව්‍ය පූජාවට පවුලේ සැවොම සහභාගි විය යුතු බව පවසන්න.
- එදින අරුත් බරව දිව්‍ය පූජාවට සම්බන්ධ වන ආකාරය පහදන්න.
- නත්තලේ සැබෑ අර්ථය බෙදා ගැනීම, සතුට, ආදරය බව සිසුන්ට මතක් කර දෙන්න.
- අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසන්න.
- නත්තල් ප්‍රීතිය වෙනුවෙන් කරන ක්‍රියාවන් පිළබඳ ව විවෘත සාකච්ඡාවක් පන්තිය තුළ ඇති කරන්න.
- නත්තලේ අරුත වන "බෙදා ගැනීමේ" පණිවිඩය පන්ති කාමරය තුළ අරුත් ගැන්වීමට සුදුසු පුද්ගලයෙකු පන්ති කාමරයට කැඳවන්න.
- නත්තල් දින බෙදා ගැනීම සඳහා රැගෙන ආ ද්‍රව්‍ය මීසම් භාර පියතුමා කන්‍යා සොහොයුරිය හෝ විදුහල්පති තුමා මගින් රහසිගත ව බෙදා දෙන්න.
- පහත වැකි ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග ශබ්ද නඟා කියවන්න.

නත්තල් දින පල්ලි යමු.
දුගී සැමට උදවු කරමු.
සාමය සතුට බෙදා ගනිමු.
කිතු උපත සතුටින් සමරමු.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ක්‍රියාකාරකම 1
  - නත්තල පිළිබඳ ප්‍රහේලිකාව සම්පූර්ණ කරවන්න. පෙළ පොතේ අඩංගු වැකි අවබෝධයෙන් කියවන්න.
- ක්‍රියාකාරකම 2
  - සිසුන් රැගෙන ආ ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් වැඩ පොතේ නත්තල් ගස සරසවන්න.
  - නත්තල් ගස යට ඇති තෑගි ද වර්ණවත් කරවන්න.
  - නත්තලේ අරුත වන බෙදා හදා ගැනීම සනිටුහන් කරමින් රැගෙන ආ තෑගි බෙදා ගැනීමට සිසුන් යොමු කරවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරීව සහභාගි වෙයි. | 4.1.1 | නත්තල් දා ක්‍රියාකාරීව දිව්‍ය පූජාවට සහභාගි වෙයි. | නත්තල් දා ක්‍රියාකාරී ව දිව්‍ය පූජාවට සහභාගි වීම තරමක් දුරට සිදු වේ. | නත්තල් දා ක්‍රියාකාරී ව දිව්‍ය පූජාවට සහභාගි වීම සහය ඇතිව සිදු වේ | නත්තල් දා ක්‍රියාකාරී ව දිව්‍ය පූජාවට සහභාගි වීමේ දුෂ්කරතා දක්වයි. |
| | 4.2.1 | නත්තල් දින දුගීන් සමග බෙදා ගත් දේවල් ප්‍රකාශ කරයි. | නත්තල් දින දුගීන් සමග බෙදා ගත් දේ තරමක් දුරට ප්‍රකාශ කරයි. | නත්තල් දින දුගීන් සමග බෙදා ගත් දේ සහය ඇතිව ප්‍රකාශ කරයි | නත්තල් දින දුගීන් සමග බෙදා ගත් දේ ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 6 සංකල්පය - සමාජීය හා සංස්කෘතික සංවේදීතාව

## ශුද්ධ වූ නිකුලස් මුනිතුමා

කිතු සමිඳුන් අනුව ගමන් කළ ශුද්ධවන්තයන් අතර, සැබෑ නත්තල අර්ථ ගැන්වූ ශුද්ධ වූ නිකුලස් තුමා ආදර්ශ කර ගනිමින් සැබෑ නත්තලේ ප්‍රීතිය අද්දැකීම මෙහි අරමුණයි.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | සාන්තුවර චරිත | 4.3 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.2 අදහස් ප්‍රකාශ කරයි. |

**ඉගෙනුම් සම්පත් :**

- කිතුනු ගී 431 - ගීතිකාව අඩංගු සී.ඩී. තැටිය
- සාන්ත නිකුලස් තුමාව නිරූපණය කිරීමට හැකි ඇඳුම් පැලඳුම්
- අන් අය හා බෙදා හදා ගත හැකි ද්‍රව්‍ය (නත්තල් තෑගි)
- සාන්ත නිකුලස් තුමාගේ තොප්පිය හා ඒ මත නම ලියා ඇලවීමට අවශ්‍ය කඩදාසි තීරු
- දුගීන් සමග බෙදා ගත හැකි ද්‍රව්‍ය
- සාන්ත නිකුලස් තුමාගේ චිත්‍රය
- සාන්ත නිකුලස් තුමා පිළිබඳ බාගත කර ගත් චිත්‍රපටය
- නත්තල් සැරසිලි/කේක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- සාන්ත නිකුලස් තුමා පිළිබඳ බාගත චිත්‍රපටය ප්‍රදර්ශනය කර ඔහු සැබෑ නත්තල් සීයා බව හඳුන්වා දෙන්න.
- නත්තල් සීයා වෙළඳ ලෝකයේ දක්නට ඇති පරිදි විකට චරිතයක් නොවන බව අවබෝධ කරවන්න.
- එම උසස් සාන්තුවරයාගේ උසස් ගුණාංග චිත්‍රපටය ඇසුරෙන් පහදා දෙන්න. සැරසිලි යොදා ගනිමින් පන්ති කාමරය තුළ නත්තල් උත්සවය පවත්වන්න.
- රැගෙන ආ ආහාර බෙදා ගන්න.
- නත්තල් බැති ගී ගායනා කරවන්න.
- නත්තල් තෑගී බෙදාගැනීම පිළිබඳ අද්දැකීම සිසුන්ට ලබා දෙන්න.
- සාන්ත නිකුලස් තුමාගේ අතින් සැම සිසුවෙකුට ම තෑගි දෙමින් සිසුන් සතුටු කරවන්න.
- සැබෑ නත්තලේ අරුත ගැන අවබෝධ කර දී අන් අය හා බෙදාගත හැකි දේ පාට කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- දුගීන් අසරණයින් පිළිබඳ සොයා බලා, ඔවුන් සමග බෙදා හදාගෙන, නත්තල සැමරීම තුළින් ජේසු සමිඳුන් ඔබ නිවෙස තුළ උපදින බව සිසුන්ට පහදා දෙන්න.

පියවර 02

- සාන්ත නිකුලස් තුමාගේ සැබෑ චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- මෙතෙක් ඔබ දැන සිටි නත්තල් සීයා මෙම සාන්තුවරයා නොවීමට හේතු විමසන්න.
- දුගීන් සමග රහසිගත ව බෙදාහදාගත් මෙම සාන්තුවරයා කිසි සේත් විකටයෙක් නොවන බවත් එතුමන්ට නිගරු වන ලෙස ක්‍රියා කිරීම වැරදි ක්‍රියාවක් බව පවසන්න.
- ශුද්ධ වූ නිකුලස් තුමාගේ චරිතය ගැන සිසුන්ට අවබෝධ කරවන්න.
- නත්තලේ සැබෑ අරුත පෙන්වා දෙමින් තම ධනය වස්තුව දුගීන්ට බෙදා දුන් අයුරු කතාන්දර ස්වරූපයෙන් සිසුන්ට පවසන්න.

- දුගී අය හා බෙදා හදා ගත හැකි දේවල් සිසුන්ගෙන් විමසන්න. ඒවා නම් කරන්න.
- යාච්ඤාවක් මගින් දුගීන් වෙනුවෙන් මැදිහත් වීමේ වැදගත්කම සිසුන්ට අවබෝධ කර දෙන්න.

පියවර 03

- වැඩ පොතේ අඩංගු ගීතිකාව අවබෝධයෙන් යුතු ව කියවන්න.
- සංයුක්ත තැටිය යොදා ගනිමින් තාලයට ගයමින් රඟ දක්වන්න.
- සාන්ත නිකුලස් තුමාගේ තොප්පිය සම්පූර්ණ කරන්න. සැබෑ නත්තලක් සැමරීම සඳහා තමන් යාච්ඤා කළ යුතු අයගේ නම් ලියා තොප්පියේ රඳවන්න. එම තොප්පි සියල්ල ම ප්‍රදර්ශනය කරවන්න.
- පන්තියේ සැම දෙනා එකතුවී නත්තලක් සැමරිය නොහැකි අය උදෙසා යාච්ඤා කරන්න.
- හැකි හැමවිට ම අන් අය වෙනුවෙන් උපකාර කරවන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ක්‍රියාකාරකම 1 හි ගීතිකාව ශබ්ද නගා අර්ථවත්ව ගායනා කරමින් රංගනයේ යොදවන්න.
- ක්‍රියාකාරකම 2 හි දුගී අය හා බෙදා ගත හැකි දේවල් කඩ ඉරමත ලියවන්න. දී ඇති වැකිය ගළපා මල්ල මත ලියවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | 4.3.2 | නත්තල් උත්සවයකට සහභාගි වී අදහස් ප්‍රකාශ කරයි. | නත්තල් උත්සවයකට සහභාගි වී තරමක් දුරට අදහස් ප්‍රකාශ කරයි. | නත්තල් උත්සවයකට සහභාගි වී සහාය ඇතිව අද්දැකීම් ප්‍රකාශ කරයි. | නත්තල් උත්සවයකට සහභාගි වී අදහස් ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 7

## සංකල්පය - සමාජීය හා සංස්කෘතික සංවේදීතාව

# නත්තල් බැති ගී

නත්තල් බැති ගී අරුත්බරව ගායනා කරමින් නත්තලේ අරුත වටහා ගෙන ක්‍රිස්තියානි සංස්කෘතියේ වටිනාකම් ඉදිරියට රැගෙන යාම මෙහි අරමුණ වෙයි.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4. ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගි වී අද්දැකීම් ලබයි. | උත්සව හා සැමරුම් | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.1.1 ක්‍රියාකාරීව සහභාගි වෙයි. |

**ඉගෙනුම් සම්පත් :**

- කැරොල් ගීත අඩංගු සංයුක්ත තැටි
- ගවලෙනක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය
- නත්තල් සුබ පැතුම් පතක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය/ දැති කතුරක්
- පාට
- ඉරටුව තුළ රැඳවූ තරුව
- කැරොල් ගායානා කිරීමට පරිසරය සකස් කිරීමට අවශ්‍ය සැරසිලි හා ඇඳුම් පැලඳුම්
- රෑ තරු බබලනවා ගීතිකාව අඩංගු පෝස්ටරය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1

- සමූහ කැරොල් ගී අඩංගු වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතිකාවලට දෙනෙත් පියා ගෙන සවන් දීමට යොමු කරවන්න.
- අත් පොළසන් දෙමින් රඟමින් සතුටින් කැරොල් ගී ගායනා කරවන්න.
- ගායනා කරන ලද කැරොල් ගීතවල අඩංගු වන අදහස් ඉස්මතු කර ගන්න.
- කිතු උපත උත්සවාකාරයෙන් සැමරිය යුතු බව පවසන්න.
- කැරොල් ගී ගායනා කළ යුතු ආකාරය අවබෝධ කර දෙන්න.

පියවර 2

- සීනුහඬින් ගීතිකාව සියලු ම සිසුන් ලවා ගායනා කරවන්න.
- නත්තලේ සුන්දරත්ව ය ගීතිකාව තුළින් මතුවන ආකාරය පෙන්වා දෙන්න.
- "කලකට පෙර ගීතිකාවේ" අඩංගු කිතු උපතේ කතාව සිසුන්ට මතක් කර දෙන්න.
- බැතියෙන් එම ගීතිකාව ගායනා කරමින් එහි අර්ථය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- රෑ තරු බබළනවා ගීතිකාවේ අදහස සිසුන් තුළින් මතු කර ගන්න. එම ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න. (කිතුනු ගී 430)
- ඉරටුව තුළ රැඳවූ තරුව අතට ගෙන කණ්ඩායම් අනුව ඒකරාශී වී ගායනා කරවන්න.
- ගායනා කරන ලද සියලුම කණ්ඩායම් ඇගයීමට ලක් කරන්න.
- හැකි නම් විවිධ ඇඳුම් පැලඳුම් භාවිත කරමින් කැරොල් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට නියමිත ගීතිකාව බැගින් සපයන්න.
- කැරොල් ගී කණ්ඩායම් තරගයක් පවත්වා දක්ෂ සිසුන් අගයන්න.
- වාදනයට හැකියාව ඇති සිසුන් සිටී නම් ඔවුන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව දෙන්න.
- සියලු ම සිසුන් අගය කරන්න.

පියවර 3

- පෙර දැනුම් දුන් පරිදි නත්තල් සුභ පැතුම් පතක් සකස් කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න. නිර්මාණශීලී ව සුභ පැතුම් පත සකස් කිරීමට  අවශ්‍ය දේ රැගෙන ආ සිසුන්ගේ අදහස් විමසන්න.
- සුබ පැතුම් පත සකස් කිරීමට අවශ්‍ය දේ නොමැති සිසුන්ට භාග කඩදාසි පාට හා ගම් ලබා දෙන්න.
- සුබ පැතුම් පත යොමු කරන්නේ කාට දැයි සිසුන්ගෙන් විමසා එය සඳහන් කරවන්න. අවසානයේ නැවත පන්තිය පිරිසිදු කරවන්න.
- සිසුන්ගේ සුබ පැතුම් පත් ප්‍රදර්ශනය කරවන්න.
- මව හා පියාට සුබ පැතුම් පතක් අනිවාර්ය බව පවසන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ක්‍රියාකාරකම 1
  - තාලයට ගායනා කරවන්න / වාදනය හා රංගනය
- ක්‍රියාකාරකම 2
  - දී ඇති රූපය අනුව වර්ණ කරවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට ක්‍රියාකාරී ව සහභාගි වෙයි. | 4.1.1 | කැරොල් බැති ගී ක්‍රියාකාරී ව ගායනා කරයි. | කැරොල් බැති ගී තරමක් දුරට ක්‍රියාකාරී ව ගායනා කරයි. | කැරොල් බැති ගී සහය ඇති ව ක්‍රියාකාරී ව ගායනා කරයි. | කැරොල් බැති ගී ක්‍රියාකාරී ව ගායනා කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# 8 සංකල්පය - ආචාරධර්ම සාරධර්ම හා සම්මතයන්

## දහම් දෙසූ ජේසු කුමරු

ජේසු බිළිඳුන් දේව මාලිගායේ කැප කිරීමත්, පාස්කු උත්සවය සැමරීමට වැඩිය ආකාරයත් අවබෝධ කරගෙන තම දේවස්ථානය තුළ නිවැරදි ව, ගෞරවාන්විත ව, හැසිරීමට පිළිපැදිය යුතු සිරිත් විරිත් අනුගමනය කිරීම මෙහි අරමුණ වේ

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7. යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු සිරිත් විරිත් අනුගමනය කරයි. | කිතුනු ගුණාංග යහපත් සිරිත් විරිත් | 7.1 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම හඳුනා ගනී.<br>7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.1.1 නිවැරදි ව හඳුනා ගනී<br>7.3.1 නිවැරදි හැසිරීම් |

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය ( ශු. ලූක් 2: 22)
- රංගනයට අවශ්‍ය ඇඳුම් පැළඳුම්
- බාලයන් මා වෙතට එන්න ඉඩ දෙනු - ගීතිකාව (සිඟිතිකා-2) අඩංගු සංයුක්ත තැටිය/ youtube
- පාට, ගම්
- යහපත් ගුණධර්ම අඩංගු පුවරුව ( මම යහපත් දරුවෙක් වෙමි.)
- ජේසු සමිඳුන්ගේ ළමාවිය පිළිබඳ බාගත කරන ලද චිත්‍රපටය
- අන්නා හා සිමියොන්ගේ චිත්‍ර

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1**

- බාගත කළ ජේසු සමිඳුන්ගේ ගේ ළමාවිය අඩංගු චිත්‍රපටයේ සුවිශේෂ අවස්ථා ප්‍රදර්ශනය කරන්න.
- මෝසගේ නීතිය අනුව ජේසු බිළිඳුන් දේව මාලිගාවේ කැප කළ බවත්, ජේසු කුමරුන් පාස්කුව සැමරූ බවත් අවබෝධ කර දෙන්න.
- පෙර දැනුම් දුන් පරිදි ජේසු බිළිඳුන් දේව මාලිගාවේ කැප කිරීමේ අවස්ථාව රංගනය කරවන්න.
- රංගනය කරන ලද චරිත පිළිබඳ සිසු අදහස් විමසන්න.
- සිමියොන් හා අන්නාගේ චරිත පිළිබඳ ව අදහස් සිසුන්හට පහදන්න. එම පින්තූර ප්‍රදර්ශනය කර කරුණු දක්වන්න.
- ශු. ලූක් 2: 22 හි අඩංගු දේව වචනය ගෞරවයෙන් හා අර්ථාන්විත ව කියවන්න.
- ජේසුස් වහන්සේව කැප කිරීමේ පිළිවෙත පැහැදිලි කර දී ක්‍රියාකාරකම් පොතේ සඳහන් "බාලයන් මා වෙතට එන්න ඉඩ දෙනු" ගීතිකාව ශ්‍රවණය කරවන්න.
- රඟමින් වයමින් බැතියෙන් ගයන්න. සිසුන් අගය කරන්න.
- යහපත් දේව දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම අවබෝධ කරන්න.

උදා - තම වැඩ කටයුතු නිසිලෙස ඉටු කිරීම, පිරිසිදු ව සිටීම, අන්අය සමඟ බෙදා හදා ගැනීම සතුටින් අවට පරිසරය පිරිසිදු කිරීම, කීකරු කම වැනි ගුණාංග

පියවර 2

- පෙර දැනුම් දුන් පරිදි අවුරුදු 12දී ජේසු කුමරුන් දේව මාලිගාවට යාමේ සිදුවීම රංගනයක යොදවන්න.
- රංගනය කරන ලද සියලු ම සිසුන්ව අගය කරන්න.
- පළමු හා දෙවන රංගනයන් තුළින් ඉදිරිපත් කළ දක්ෂතා අගයමින් අත්පොළසන් දී සිසුන් දිරි ගන්වන්න.
- අවුරුදු 12 දී ජේසු කුමරුන් දේව මාලිගාවට යාමේ කතා පුවත රසවත්ව ඉදිරිපත් කරන්න.
- සිසුන් නිශ්ශබ්ද කරවන්න. දේව වචනයට ගෞරවයෙන් සවන් දීමට යොමු කරවන්න.
- (ශු.ලූක් 2: 46)

පියවර 3

- යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම සිසුන්හට පහදා දෙන්න.
- පෙර පාඩම්වල සඳහන් යහපත් ගුණාංග නැවත මතක් කර දෙන්න.
- හැකිනම් සිසුන් රැගෙන දේවස්ථානයට යන්න. එහි දී හැසිරෙන අන්දම නැවත මතක් කරන්න.
- **මෙම ගුණාංග පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.**
  - පිරිසිදු විනීත ඇඳුම් ඇඳ දේවස්ථානයට යාම
  - දේවස්ථානය තුළ ආහාර අනුභවයෙන් වැළකීම
  - කල් තියා දේවස්ථානයට යාම
  - නිම වන තෙක් රැඳී සිටීම
- ඉහත කරුණු අඩංගු පුවරුව ප්‍රදර්ශනය කරවන්න.
- "මම යහපත් දරුවෙක් වෙමි" වන මාතෘකාව යොදන්න.
- ඉන්පසු සිසුන් කරන ලද යහපත් ක්‍රියා භාග කඩදාසියේ ලියා මෙම පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එක් එක් සිසුවාගේ නිර්මාණ අධීක්ෂණය කර තක්සේරු කරන්න.

**සිසු ක්‍රියාකාරකම් පොතට උපදෙස් :**

- ක්‍රියාකාරකම 1
  - ⅄ දේවස්ථානය තුළ හැසිරිය යුතු ආකාරය රූපය තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.
- ක්‍රියාකාරකම 2
  - ⅄ හිස්තැන් පිරවීමට උපදෙස් දෙන්න.

"බාලයන් මා වෙතට එන්න ඉඩ දෙනු" ගීතිකාව නැවත ගයමින් රංගනයක යොදවන්න.

**තක්සේරු කිරීම :**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | මට්ටම 4 | මට්ටම 3 | මට්ටම 2 | මට්ටම 1 |
| 7.1 යහපත් දරුවෙකු ලෙස ගුණ ධර්ම හඳුනා ගනී. | 7.1.1 | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම ප්‍රකාශ කරයි. | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම තරමක් දුරට ප්‍රකාශ කරයි. | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම සහය ඇතිව ප්‍රකාශ කරයි. | යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු ගුණධර්ම ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 7.3 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.3.1 | දේවස්ථානයේදී යහපත් දරුවෙකු ලෙස හැසිරෙයි. | දේවස්ථානයේදී යහපත් දරුවෙකු ලෙස තරමක් දුරට හැසිරෙයි. | දේවස්ථානයේදී යහපත් දරුවෙකු ලෙස සහය ඇතිව හැසිරෙයි. | දේවස්ථානයේදී යහපත් දරුවෙකු ලෙස හැසිරීමේ දුෂ්කරතා දක්වයි. |

කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය (සි)
1 ශ්‍රේණිය